# 1958 අංක 15 සේවක අර්ථසාධක අරමුදල් පනත

**2012 අංක 02 දක්වා සංශෝධන ඇතුළත්ය.**

# 1958 අංක 15 සේවක අර්ථසාධක අරමුදල් පනත

**ඇතැම් සේවක පන්තිවල ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීමටත් ඒ හා සම්බන්ධ වූ හෝ එයට අදාළ වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමටත් පනවනු ලබන පනතකි.**

( අනුමැතිය ලැබූ දින 1958 මැයි 9 )

ලුහුඬු නාමය හා වලංගු වන දිනය

වර්තමාන පාර්ලිමේන්තුවට රැස්වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනුව හා ඇති ව එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල පනත නමින් හැඳින්විය හැකිය. ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවකින් නියම කෙරෙන (මේ පනතෙහි මින් මතු නියම කළ දිනය වශයෙන් සඳහන් කෙරෙන ) දිනයක මේ පනත වලංගු විය යුතුය.

## I වෙනි කොටස

## සේවක අර්ථසාධක අරමුදල පිහිටුවීම හා එහි සාමාජිකත්වය, සහ මේ පනත හා ඒ අරමුදල ක්‍රියාවේ යෙදවීම.

සේවක අර්ථසාධක අරමුදල පිහිටුවීම

2. මේ පනතෙහි කාර්යයන් සඳහා ( මින් මතු මේ පනතෙහි අරමුදල යයි සඳහන් කෙරෙන) සේවක අර්ථසාධක අරමුදල නමින් අරමුදලක් පිහිටුවිය යුතුය.

අරමුදලෙහි සාමාජිකත්වය

3. (1) 10 වෙනි වගන්තිය යටතෙහි අරමුදලට දායක මුදල් ගෙවීමට සේවකයකු පළමුවෙන් යටත්වෙන අවස්ථාවක, ඔහු අරමුදලෙහි සාමාජිකයකු වී, ඔහුගේ පුද්ගලික ගණයෙහි අය පක්ෂයෙහි යම් මුදලක් තිබෙන තුරු අරමුදලෙහි සාමාජිකයෙකුව සිටියි.

2012 අංක 02

" (1 අ) (1) වන උපවගන්තිය යටතේ ස්ථාපිත අරමුදලේ යම් සේවා නියුක්තිකයකු සාමාජිකයකු බවට පත්වන අවස්ථාවක කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමිත ආකාරයට එම සේවා නියුක්තයාට සහ සේවා යෝජකයාට හඳුනාගැනීමේ අංකයක් ලබා දිය යුතුය. "

(2) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ යම් නියෝගයක බලය පිට මිස අරමුදලෙහි සාමාජිකයකුට හෝ ඔහු යටතෙහි ඉල්ලුම් කරන යම් තැනැත්තකුට අරමුදලෙහි මුදල්වලට යම් සම්බන්ධතාවක් හෝ හිමිකමක් නො තිබිය යුතු ය.

මේ පනත ක්‍රියාවේ යෙදවීම

4. (1) මේ පනතෙහි වෙන අන්දමකින් සලස්වනු ලැබූ තැන්හි හැර, කම්කරු කොමසාරිස්වරයා මේ පනත සාමාන්‍යයෙන් ක්‍රියාවේ යෙදවීම භාර ව සිටිය යුතුය.

(2) කම්කරු කොමසාරිස්වරයාගේ යම් සාමාන්‍ය හෝ විශේෂ නියමවලට යටත් ව, යම් කම්කරු නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ යම් සහකාර කම්කරු කොමසාරිස්වරයකු විසින් මේ පනත යටතෙහි හෝ යම් නියෝගයක් යටතෙහි කොමසාරිස්වරයාගේ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක් පාවිච්චි කළ හැකිය . ඉෂ්ට කළ හැකිය, නැතහොත් ක්‍රියාවේ යෙදවිය හැකිය.

(3) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සංඛ්‍යාවක් පත් කළ හැකිය.

(4) මේ පනත යටතෙහි හෝ යම් නියෝගයක් යටතෙහි කොමසාරිස්වරයාගේ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක් පාවිච්චි කිරීමට හෝ ඉෂ්ට කිරීමට නැතහොත් ක්‍රියාවේ යෙදවීමට මේ වගන්තියෙහි (3) වෙනි උපවගන්තිය යටතෙහි පත් කරන ලද යම් නිලධරයකුට කම්කරු කොමසාරිස්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරිය හැකිය.

අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙහි බලතල හා යුතුකම්

5. මුදල් මණ්ඩලය විසින් --

1971 අංක 08

එම වගන්තිය 5 වන වගන්තියේ (1) වන උප වගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(අ) මේ පනත යටතෙහි ස්වකීය බලතල පාවිච්චි කිරීම, ස්වකීය යුතුකම් ඉෂ්ට කිරීම හා ස්වකීය කාර්යයන් කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත් කළ හැකි ය ; ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප් හා වේතන ද නියම කළ හැකිය; ඔවුන්ගේ සේවා කොන්දේසි ද නිශ්චය කළ හැකිය;

(ආ) දායක මුදල් හා වැඩිපුර අයකරන ගාස්තු වශයෙන් මේ පනත යටතෙහි ගෙවනු ලැබූ සියලු මුදල් හා අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම භාර ගෙන ඒ මුදල හා ආදායම අරමුදලට එකතු කළ යුතුය;

1971 අංක 08 (ආ) ඡේදයේ " දායක මුදල් සහ අධිභාර " යන වචන වෙනුවට "දායක මුදල්, අධිභාර සහ ගාස්තු " යන වචන ආදේශ කිරීමෙන් :-

1985 අංක 01 " (ආආ) ස්වකීය සේවායෝජකයන් විසින් අරමුදලට ගෙවනු ලැබිය යුතු දායක මුදල් එසේ ගෙවිය යුතු දිනයේ දී ගෙවීම් ඔවුන් පැහැර හැරීම නිසා පාඩුවන සාමාජිකයන් අතර 16 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිභාරයක් ලෙස ලබාගත් මුදල්වලින් බෙදනු ලැබිය යුතු අධිභාරයේ ප්‍රමාණය අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය: " සහ

(ඇ) අරමුදලෙහි මුදල් වල භාරය දැරිය යුතුය;

(ඈ) කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ තැනැත්තන්හට මේ පනත යටතෙහි හිමි ප්‍රතිලාභ ගෙවිය යුතුය;

(ඉ) මේ පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලෙහි මුදල්, මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන තැන්පත් ඇප වල යොදා ඒ තැන්පත් ඇප විකිණිය හැකිය;

2012 අංක 02 (ඉඉ) අරමුදලේ ප්‍රයෝජනය පිණිස අරමුදල වෙනුවෙන් ලේකම් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීම හෝ අරමුදලට අයත් නැතහොත් අරමුදල විසින් දරනු ලබන යම් ඉඩමක එවැනි ලේකම් කාර්යාලයක් ඉදිකිරීම සඳහා අරමුදලේ යම් මුදල් ප්‍රමාණයක්, නියම කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට අනුව ආයෝජනය කළ හැකි ය සහ ; "

(ඊ) අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍යය ගණනක් ද අරමුදලෙහි එක් එක් සාමාජිකයකු සම්බන්ධයෙන් ( මේ පනතෙහි පුද්ගලික ගණන යයි සඳහන් කරනු ලැබූ ) වෙන ම ගණනක් ද පවත්වා ගෙන යා යුතුය;

1988 අංක 42 " (ඊඊ) සේවායෝජකයන් විසින් මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් හෝ අනුව අදාළ වාර්තා

සැපයීමට අපොහොසත් වූ නැතහොත් ඌනතා සහිත හෝ සාවද්‍ය වාර්තා සැපයීම නිසා පෞද්ගලික ගිණුම්වලට බැර කළ නොහැකි මේ පනත යටතේ ලැබුණු දායක මුදල් බැර කළ යුතු අවිනිශ්චිත ගිණුමක් පවත්වා ගෙන යා යුතු අතර , මෙම ඡේදය බලාත්මක වන දින එවැනි දායක මුදල් සම්බන්ධයෙන් අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට අයත් සියලු මුදල් මූල්‍ය මණ්ඩලය විසින් , මෙම ඡේදය මගින් නිර්මිත අවිනිශ්චිත ගිණුමට පැවරිය යුතුය.

ඉහත සඳහන් පරිදි අදාළ වාර්තා සැපයීමට අපොහොසත් වූ සේවායෝජකයකු විසින් ස්වකීය සේවකයා සම්බන්ධයෙන් නිවැරදි වාර්තා සපයනු ලබන විට හා එවැනි අවස්ථාවක, මූල්‍ය මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමෙහි පවත්නා මුදල් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට පැරිය යුතුය.

මෙම ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අවිනිශ්චිත ගිණුමෙන් පෞද්ගලික ගිණුමකට මුදල් කිසිවක් පවරනු ලබන අවස්ථාවක, එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල් ලැබුනු දින සිට එම මුදල් පෞද්ගලික ගිණුමට පවරනු ලබන දින දක්වා වූ කාලය සඳහා එම මුදලට පොලියක් ගෙවිය යුතු අතර , පොලී අනුපාතය මෙම පනතේ 14 (1) වන වගන්තිය අනුව තීරණය කළ යුතුය; තවද පොලී අනුපාතය, එය ගෙවනු ලබන වර්ෂය සඳහා අදාළ විය යුතුය ;

2012 අංක 02 (ඊඊ) ඡේදයේ " එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල්, සහ " යන වචන වෙනුවට " එම මුදල් " යන වචන ආදේශ කිරීමෙන්.

(උ) හැම අවුරුද්දක ම දෙසැම්බර් මස තිස් එක් වෙනි දින අරමුදල සම්බන්ධ ගණන් පොත් තුලනය කර විය යුතුය;

(ඌ) එක් එක් අවුරුද්දක් සඳහා අරමුදල සම්බන්ධයෙන් ලැබීම් හා ගෙවීම් විස්තරයක් ද, අය වැය විස්තරයක් ද, වත්කම් හා බැදීම් විස්තරයක් ද එක් එක් තැන්පත් යෙදවීමක ප්‍රකාශක අගය , ගැනුම් මිල හා වෙළඳ පොළේ මිල පෙන්නුම් කරන තැන්පත් යෙදවීම් විස්තරයක් ද සකස් කරවිය යුතුය;

(එ) ඉහතින් වූ (ඌ) ඡේදය යටතෙහි එක් එක් අවුරුද්දක් සඳහා සකස් කරන ලද එක් එක් විස්තරයක පිටපතක් ඒ අවුරුද්දෙහි දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට පසු තුන් මසක් ඇතුළත ඇමතිවරයා වෙත යැවිය යුතුය ;

(ඒ) එක් එක් අවුරුද්දෙහි ම දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට පසු තුන් මසක් ඇතුළත , අරමුදලෙහි එක් එක් සාමාජිකයකුට එදිනට ඔහුගේ පුද්ගලික ගණනෙහි එකතුවට තිබෙන ප්‍රමාණය දැනුම් දිය යුතුය;

1971 අංක 08 (ඒ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

(ඒ) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින ඒ සාමාජිකයාගේ පුද්ගල ගිණුමේ බැරට ඇති මුදල --

(1) ආවරණය වූ සේවා නියුක්තියක සේවයේ නියුක්තව සිටින අරමුදලේ එක් එක් සාමාජිකයාගේ සේවා යෝජකයාට ; සහ

(11) ආවරණය වූ සේවා නියුක්තියක සේවයේ නියුක්තව සිටීම නතර වූ අරමුදල් එක් එක් සාමාජිකයාට එක් එක් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයෙන් පසු මාස නවයක් ඇතුළත දැනුම් දිය යුතුය. ;

(ඔ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේදී මණ්ඩලයට හා කොමසාරිස්වරයාට දරන්නට සිදු වූ වියදම් අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායමෙන් අඩු කළ යුතුය;

1970 අංක 16 (අ) " අඩු කළ යුතුය", යන වචන වලට " 7(අ) වගන්තියේ විධිවිධාන වලට යටත්ව අඩු කළ යුතුය" ; යනුවෙන් ආදේශ කිරීමෙන් සහ

(ආ) "මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී " යන වචන වලට "මෙම පනත යටතේ ඔවුන් සතු කර්තව්‍ය ඉටු කිරීමේදී " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඔ) ඡේදයේ " කළයුතුය; සහ " යන වචන වෙනුවට " කළයුතුය ;" යන වචන ආදේශ කිරීමෙන්,

එහි (ඔ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

1971 අංක 08 " (ඔ) අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන්, මේ පනත යටතේ මණ්ඩලය සහ කොමසාරිස්වරයා සතු කර්තව්‍ය ඉටු කිරීමේදී මණ්ඩලය සහ කොමසාරිස්වරයා විසින් දරණු ලැබූ වියදම් අඩුකළ යුතුය."

1971 අංක 08 " (ඔඔ) යම් හදිසි අවස්ථා හෝ අරමුදලේ වත්කම්වල වෙළඳ පොළ අගයේ යම් ක්ෂයවීමක් සඳහා මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ සංචිත , අරමුදලේ ආදායමින් ඇති කළ හැකිය; සහ "

1988 අංක 42 " (ඔඔඔ) 22 වන වගන්තිය යටතේ වූ නිවාස ණයක් මත ලැබිය යුතු හිඟ මුදල් කිසිවක් , ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගෙන් ලැබෙන නියමයක් අනුව සාමාජිකයකුගේ පෞද්ලික ගිණුමෙන් අඩු කර ගතයුතු අතර, එසේ අඩුකර ගත් මුදල අදාළ ණය දෙන ආයතනයට පැවරිය යුතුය; "

(ඕ) මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇති ව ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවකින් මණ්‍ඩලය වෙත පැවරිය හැකි හෝ නියම කළ හැකි අරමුදල සම්බන්ධ වෙනත් බලතල හා යුතුකම් ද ලැබිය යුතුය.

1971 අංක 08 (2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද සෑම නිලධාරියකු හා සේවකයකුම මුදල් නීති පනත යටතේ කාර්ය ඉටුකිරීම සඳහා සේවයේ නියුක්ත කරනු ලැබූ ලෙස, එකී පනතේ නිලධරයන්ට හා සේවකයන්ට අදාළ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා සැලකිය යුතුය.

1971 අංක 08 (3) (1) වන උප වගන්තියේ (ඔ) ඡේදය කාර්ය සඳහා, " වියදම් " යන්නට-

(1) සොරකම් කිරීම, අයථා පරිහරණය හෝ වැඩියෙන් ගෙවීම නිසා ඇතිවූ යම් මුදල් පාඩුවක්,

(11) අරමුදලේ පරිපාලනයේදී භාවිතා කරනු ලැබූ හෝ ඒ සඳහා මිලදී ගත් හෝ ගෘහ භාණ්ඩ , කාර්ාාල උපකරණ හෝ ලිපිද්‍රව්‍ය නැතිවී ඒවායේ වියදම එම නැතිවීමට වගකිව යුතු තැනත්තන්ගෙන් අයකර ගත නොහැකි වූ විට ; සහ

(111) ප්‍රයෝජනයට ගත නොහැකි වීමේ හේතුව මත ලියා අස් කරන ලද යම් ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හෝ ලිපිද්‍රව්‍ය යමක වටිනාකම,

ඇතුළත් විය යුතුය.

මමුදල් මණ්ඩලය විසින් දැනුම් දෙන තොරතුරු සේවායෝජක විසින් සාමාජිකයකුට දැන්විය යුතු බව

5 අ. අරමුදලේ සාමාජිකයකුගේ පුද්ගල ගිණුමෙහි බැරට ඇති මුදල ගැන මුදල් මණ්ඩලය විසින් 5(1)(ඒ) වගන්තිය යටතේ සේවායෝජකයකුට දැනුම් දෙන ලද අවස්ථාවක, එසේ දැනුම් දෙන ලද තොරතුරු එම සේවායෝජකයා විසින් එම සාමාජිකයාට දැනුම් දිය යුතුය. 1971 අංක 08

අරමුදලලෙහි ගිණුම් ආදිය ගණන් පරීක්ෂකාධිකාරීවිසින් පරීක්ෂා කිරීම

6. (1) එක් එක් අවුරුද්දක් සම්බන්ධයෙන් අරමුදලෙහි ගණන් හිලවු ගණන් පරීක්ෂකාධිකාරී විසින් පරීක්ෂා කළ යුතුය . ගණන් පරීක්ෂණයෙහි ගාස්තු ඔහුට අරමුදලෙන් ගෙවිය යුතුය. මේ උප වගන්තිය යටතෙහි ඔහුට ගෙවනු ලැබූ සියලු ගෙවීම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට එකතු කළ යුතුය.

(2) ගණන් පරීක්ෂකාධිකාරීට හෝ අරමුදලෙහි ගණන් හිලව් පරීක්ෂා කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ඒ ගණන් හිලව් පරීක්ෂා කිරීමේ කාර්යයන් සඳහා ගණන් පරීක්ෂකාධිකාරී හෝ ඒ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු පොත්පත් බලා ගැනීමට ඉඩ තිබිය යුතුය. තව ද මුදල් මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් ඒ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ඔවුන් දන්නා හා ඔවුන් විසින් සොයා දැනගත හැකි තොරතුරු සැපයිය යුතුය.

(3) ගණන් පරීක්ෂකාධිකාරී විසින් අරමුදලෙහි ගණන් හිලව් පරීක්ෂා කොට --

(අ) ඔහුට අවශ්‍ය සියලු තොරතුරු ඔහු විසින් ලබා ගනු ලැබුවේ ද නැද්ද යනු සඳහන් කරමින් ද,

(ආ) අරමුදලෙහි කටයුතු සම්බන්ධ සත්‍ය හා නිවැරදි අදහසක් දැක්වෙන පරිදි වාර්තාවෙහි සඳහන් ගණන් හිලව් නිසි ලෙස සකස් කොට තිබේ ද යනු සඳහන් කරමින් ද,

(ඇ) ඒ ගණන් හිලව් සම්බන්ධ යම් පරීක්ෂණයක දී ඔහුගේ මතය අනුව උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සැලකිලිමත් විය හැකි ඒ ගණන් හිලව්වල යම් විෂයකට අවධානය යොමු කරමින් ද,

ඇමතිවරයාට අවුරුදු පතා වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

අරමුදලෙහි කිසි සාමාජිකයකුගේ නම ඒ වාර්තාවෙන් අනාවරණය නො කළ යුතුය.

(4) මේ වගන්තියෙහි (3) වෙනි උප වගන්තිය යටතෙහි ඇමතිවරයාට ඉදිරිපත් කරන ලද පරීක්ෂකාධිකාරීගේ වාර්තාවේ පිටපතක් ද, 5 වෙනි වගන්තියෙහි (එ) ඡේදය යටතෙහි මුදල් මණ්ඩලය විසින් ඇමතිවරයාට සපයන ලද විස්තරවල පිටපත් ද ඇමතිවරයා විසින් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතුය.

මුදල් මණ්ඩලයට ආණ්ඩුවෙන් අත්තිකාරම්

7. (1) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් යෝජනාවකින් නිශ්වය කළ හැකි මුදල්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් --

(අ) මේ පනත පැනවූ දා සිට ආරම්භ වන දොළොස් මාස කාල පරිච්ඡේදය තුළ මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේදී ඒ මණ්ඩලයට හා කොමසාරිස්වරයාට දරන්නට සිදු වූ මූලික ධන වියදම් ඇතුළු සියලු වියදම්ද,

(ආ) මේ උප වගන්තියෙහි (අ) ඡේදයෙහි සඳහන් කරන ලද කාල පරිච්ඡේදය කෙළවර වූ දිනයට ඉක්බිතිව ම දිනයෙහි ආරම්භ වන විසිහතර මාස කාල පරිච්ඡේදය තුළ මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේ දී ඒ මණ්ඩලයට හා කොමසාරිස්වරයාට දරන්නට සිදු වූ සියලු මූලික ධන වියදම් ද,

ගෙවීම සඳහා මුදල් මණ්ඩලයට ගෙවිය යුතුය.

(2) මේ වගන්තියෙහි (1) වෙනි උප වගන්තිය යටතෙහි ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබූ සෑම මුදලක් ම රජයෙන් මුදල් මණ්ඩලයට දෙනු ලැබූ ණයක් විය යුතු අතර , මුදල් ඇමති වරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නිශ්වය කළ හැකි කොන්දේසි හා නියමයන් අනුව එය ආපසු ගෙවිය යුතුය.

1971 අංක 08

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:-

“ රජයට ගෙවීම් 7. ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් --

(1) අරමුදල පිහිටුවීම සඳහා මූලික වැඩ පිළිවෙලවල් සකස් කිරීමේදී දරන ලද වියදම් පියවීම සඳහා මේ පනත පනවන දිනයට පෙර කොමසාරිස්වරයාට ගෙවන ලද්දා වූද

(11)මේ පනත පනවන දිනයෙන් ආරම්භව 1966 සැප්තැම්බර් මස තිස්වන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය ඇතුළත මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මුදල් මණ්ඩලය විසින් සහ කොමසාරිස්වරයා විසින් දරන ලද, ප්‍රාග්ධන වියදම් ඇතුළු සියලු වියදම් පියවීම සඳහා මුදල් මණ්ඩලයට ගෙවන ලද්දාවූද,

සෑම මුදලක්ම රජය විසින් මුදල් මණ්ඩලයට දෙන ලද ණයක් විය යුතු අතර එය මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව

අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනු ලැබිය යුතුය. ”

1970 අංක 16

7 (අ) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී කොමසාරිස්වරයා දරනු ලැබූ වියදම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් අය කර ගත යුතුය.

එසේ වුව ද , මෙම පනතේ V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී කොමසාරිස්වරයා දරනු ලැබූ වියදම් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් ගෙවිය යුතුය. ”

1985 අංක 01

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුව පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

7 අ. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා සහ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබූ වියදම් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් අයතර ගත යුතුය.

## II වෙනි කොටස
## රක්ෂිත වෘත්තීන්, මේ පනත අදාල වන සේවකයන් හා දායක මුදල්

රක්ෂිත වෘත්තීන් හා මේ පනත අදාළ වන සේවකයන්

8. (1) රජය මගින් මූලික ධනය හෝ මූලික ධනයෙන් කොටසක් සපයනු ලැබූ සංස්ථාවක සේවයෙහි වූ යම් වෘත්තියක් ඇතුළු ඕනෑම වෘත්තියක් නියෝග මගින් රක්ෂිත වෘත්තියක් වශයෙන් ප්‍රකාශ කළ හැකිය.

(2) (අ) වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයන් සඳහා ලංකාවේ ගෙන යනු ලබන්නා වූ ද එය ලංකාවෙහි වූයේ නම් රක්ෂිත වෘත්තියක් විය හැකි වූ ද ලංකාවෙන් බැහැර පිහිටි යම් වෘත්තියක් රක්ෂිත වෘත්තියක් වශයෙන් සැලකීම සඳහා , සහ

(ආ) (i) සේවකයන් නියමිත අඩුම ගණනකට වඩා අඩු ගණනක් සේවයෙහි යොදන තැනැත්තකු යටතෙහි වූ වෘත්තියක්,
(ii) දවස් වශයෙන් හෝ වැඩ වශයෙන් හෝ ගමන් වශයෙන් සාමාන්‍යයෙන් කරනු ලබන වෘත්තියක්, හා
(iii) ඒ තැනැත්තාගේ හෝ තැනැත්තියගේ භාර්යාවගේ හෝ සැමියාගේ සේවයෙහි හෝ වෙළෙඳ හෝ ව්‍යාපාරික කටයුතු සඳහා හෝ කොටස්කරුවකු වශයෙන් කෙනෙකු යෙදවෙන වෘත්තිය ද

රක්ෂිත වෘත්තියක් වශයෙන් නො සැලකීම සඳහා හෝ නො තැකීම සඳහා, නියෝග පැනවිය හැකිය.

1971 අංක 08

(1) එහි (11) වන වගන්තිය අත්හැරීමෙන් ; සහ

(2) එහි (111) වන වගන්තිය (11) වන වගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්

(3) වෙන කෙනකු විසින් යම් රක්ෂිත වෘත්තියක සේවයෙහි යොදවනු ලැබූ නියමිත වයසෙන් ඉහළ හැම තැනැත්තකු ම මේ පනතෙහි වෙනත් විධිවිධානවලට යටත් ව මේ පනත අදාළ වන සේවකයකු විය යුතුය. මේ උප වගන්තියෙහි කාර්යයන් සඳහා වෙනස් රක්ෂිත වෘත්තීන් සඳහා වෙනස් වයස් නියම කළ හැකිය.

9. යම් තැනැත්තකුගේ ආසන්නතම සේවා යෝජකයා ම වෙන කෙනෙකුගේ සේවයෙහි යෙදී සිටින අවස්ථාවක හා එම ආසන්නතම සේවා යෝජකයා එකී අනෙක් තැනැත්තාගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් හා එහි කාර්යයන් සඳහා කටයුතු කිරීමට සේවයෙහි යොදනු ලැබූ අවස්ථාවක, මේ පනතෙහි කාර්යයන් සඳහා එකී අනෙක් තැනැත්තා ආසන්නතම සේවා යෝජකයාත් සමග පළමුවෙන් සඳහන් කරනු ලැබූ තැනැත්තාගේ සේවා යෝජකයා වශයෙන් සැලකිය යුතු ය.

10. (1) මේ වගන්තියේ (3) වෙනි උප වගන්තියෙහි හා 27 වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, මේ පනත අදාළ වන සේවකයකු විසින් රක්ෂිත වෘත්තියක ඔහු වැඩ කරන කාලය තුළ එක් එක් මාසයක් සම්බන්ධයෙන් ඔහුට ඒ මාසය තුළ සේවයෙන් ලැබෙන සම්පූර්ණ ඉපයීම් වලින් සියයට හතරකට සමාන ගණනක දායක මුදලක් අරමුදලට ගෙවීමට බැඳී සිටිය යුතුය. සාමාන්‍ය දායක මුදල්

1971 අංක 08

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියේ " සියයට හතරකට" යන වචන වෙනුවට " සියයට හයකට" යන වචන ආදේශ කිරීමෙන්

1981 අංක 26

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි " සියයට හයකට" යන වචන වෙනුවට " සියයට අටකට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

එසේ වුවද, මේ පනත අදාළ වන තැනැත්තකු හෝ තැනැත්තියක පළමුවෙන් සේවකයකු හෝ සේවිකාවක වන අවස්ථාවක, පුරුෂයකු සම්බන්ධයෙන් අවුරුදු පනස් පහක හෝ ස්ත්‍රියක සම්බන්දයෙන් අවුරුදු පනහක වයස් සම්පූර්ණ නම් අරමුදලට එවැනි දායක මුදලක් ගෙවීමට බැඳී සිටිය නො යුතුය.

1985 අංක 01

(1) එහි (1) වන උපවගන්තියේ ඇති " එසේ වුවද " යන වචන වලින් පටන් ගන්නා අතුරු වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) මේ වගන්තියෙහි (3) වෙනි උප වගන්තියට හා 27 වෙනි වගන්තියට යටත්ව, අරමුදලට දායක මුදල් ගෙවීමට බැඳී සිටින්නා වූ ද මේ පනත අදාළ වන්නා වූ ද හැම සේවකයකුගෙන් ම සේවා යෝජකයකු විසින්, එවැනි සේවා යෝජකයකු යටතෙහි එවැනි සේවකයකු රක්ෂිත වෘත්තියක යෙදී සිටින කාලය තුළ එක් එක් මාසයක් සම්බන්ධයෙන් ඊළඟ මාසයෙහි අන්තිම දිනයට පෙර , ඒ මාසය තුළ ඒ සේවකයාගේ සම්පූර්ණ ඉපයීම් වලින් සියයට හයකට සමාන ගණනක දායක මුදලක් අරමුදලට ගෙවීමට බැඳී සිටිය යුතුය.

1971 අංක 08

(2) එම වගන්තියේ (2) වන උප වගන්තියේ " සියයට හයකට" යන වචන වෙනුවට " සියයට නවයකට" යන වචන ආදේශ කිරීමෙන්.

1981 අංක 26

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තියෙහි " සියයට නවයකට" යන වචන වෙනුවට " සියයට දොළහකට" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එහි (2) වන උප වගන්තියේ ඇති " ඊළග මාසයෙහි අවසාන දිනයට පෙර අරමුදලට ගෙවීමට " යන වචන වෙනුවට " ඊළග මාසයෙහි අවසාන දින හෝ එදිනට පෙර අරමුදලට ගෙවීමට" යන වචන ආදේශ කිරීමෙන්.

(3) මේ වගන්තිය යටතෙහි දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් රක්ෂිත වෘත්තියක සේවකයකුගේ හා ඔහුගේ සේවා යෝජකයාගේ බැඳීම ඇමතිවරයා විසින් ඒ වෘත්තිය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ආඥාවකින් නියම කරන ලද දිනයට ඉක්බිතිවම දිනයෙහි සිට ආරම්භ විය යුතුය. මේ උප වගන්තිය යටතේ එකම රක්ෂිත වෘත්තියෙහි වෙන වෙන පංක්ති සඳහා වෙන දිනයන් නියම කළ හැකිය.

ඉහළ සියයට ගණනට ගණන් බලන ලද දායක මුදල් ගෙවීමට නියම කරගැනීම සම්බන්ධ සේවකයන්ගේ හා සේවා යෝජකයන්ගේ බලය හා එසේ නියම කර ගන්නා සේවකයන්ගේ හා සේවා යෝජකයන්ගේ බැඳීම

11. (1) මේ පනත අදාළ වන සේවකයකු හා ඔහුගේ සේවා යෝජකයා විසින් නියමිත ආකෘතියෙහි හා ආකාරයෙන් කොමසාරිස්වරයා වෙත යවන ලද දැන්වීමකින් නියමය ක්‍රියාත්මක වන දිනය වශයෙන් දැන්වීමෙහි දිනයට පසු, දැන්වීමෙහි පෙන්නුම් කරන ලද 10 වෙනි වගන්තියෙහි නියමිත සියයට ගණනට වඩා ඉහළ ගණනක් අනුව ගණන් බලන ලද දායක මුදල් ගෙවීමට නියම කර ගත හැකිය.

(2) වගන්තියෙහි (1) වෙනි උප වගන්තිය යටතෙහි දැන්වීමකින් සේවකයකු හා සේවා යෝජකයකු විසින් නියමයක් කර ගන්නා අවස්ථාවක, නියමය ක්‍රියාත්මක වන දිනයෙන් පසු ඒ නියමය අවලංගු කළ නොහැකි විය යුතු අතර ඒ දැන්වීමෙහි නියමිත සියයට ගණන අනුව ගණන් බලන ලද ගණන් මේ පනත යටතෙහි දායක මුදල් වශයෙන් ඒ දිනයෙන් පසු ගෙවීමට ඔවුන් බැඳී සිටිය යුතුය.

මේ පනත යටතෙහි සේවකයා සම්බන්ධයෙන් සේවා යෝජකයාගේ දායක මුදල් ගණන අඩු කිරීමේ කාර්යය සඳහා යම් සේවකයකුගේ ඉපයීම් අඩු කළ සේවායෝජකයාට කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමය

12. (1) නියම කර ගත් දිනයට පෙරාතුව ම අවුරුදු එකක කාල පරිච්ඡේදය තුළ හෝ ඒ දිනයෙහි හෝ ඊට පසු යම් අවස්ථාවක යම් සේවකයකුගේ සේවා යෝජකයකු විසින් ඒ දායක මුදල් අඩු කිරීමේ කාර්යය සඳහා එවැනි සේවකයකුගේ ඉපයීම අඩු කළ බව කොමසාරිස්වරයාට සතුටුදායක ලෙස පෙනේ නම් , කොමසාරිස්වරයා විසින් ලිපිගත දැන්වීමකින් ඒ සේවකයාට එවැනි අඩු ඉපයීම් ලැබෙන සම්පූර්ණ කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් ඒ කාලය තුළ සේවා යෝජකයා විසින් දායක මුදල් වශයෙන් නියම ලෙස ගෙවනු ලැබූ ගණන හා අඩු කිරීමට පෙර ඒ සේවකයාගේ ඒ ඉපයීම් පදනම් කොට ඒ දායක මුදල් ගණන් බලන ලද්දේ නම්, ඒ කාලය තුළ ඔහු විසින් ගෙවිය යුතුව තිබුණු ගණන අතර වෙනස එවැනි කොටස් වලින් හා ඒ දැන්වීමෙහි නියම කරන ලද එවැනි දින වලට පෙර ඒ සේවා යෝජකයා විසින් අරමුදලට ගෙවිය යුතු ලෙස නියම කළ යුතුය.

(2) මේ වගන්තියෙහි ( 1) වෙනි උප වගන්තිය යටතෙහි කොමසාරිස්වරයා විසින් යම් සේවා යෝජකයකුට නියමයක් කරනු ලැබූ අවස්ථාවක ඒ සේවා යෝජකයා විසින් ඒ නියෝගය අනුව ක්‍රියා කළ යුතුය.

දායක මුදලක ගණනක් ගණන් බැලීමේදී ශතයක කොටසක් ශතයක් වශයෙන් ගණන් නොගත යුතු හා ගණන් ගත යුතු අවස්ථා

13. මේ පනත යටතෙහි ගෙවිය යුතු දායක මුදලක ගණනට ශතයක කොටසක් සම්බන්ධ වන අවස්ථාවක --

(අ) ඒ කොටස ශත භාගයකට වඩා අඩු නම් ඒ භාගය ගණන් නො ගත යුතුය;

(ආ) ඒ භාගය ශත භාගයක් හෝ ඊට වැඩි වන්නේ නම් , ඒ භාගය ශතයක් වශයෙන් ගණන් ගත යුතුය.

දායක මුදල් ආදිය සම්බන්ධ පොලිය

14. (1) ඇමතිවරයාගේ හා මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් කලින් කලට නියම කළ හැකි පරිදි අවුරුද්දකට සියයකට දෙක හමාරකට නො අඩු ගණනක පොලියක් අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායමෙන් ඒ අවුරුද්දෙහි දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට අරමුදලෙහි එක් එක් සාමාජිකයකුගේ පුද්ගලික ගණනෙහි අය පක්ෂයට තිබෙන ගණනට එක් එක් සාමාජිකයකුගේ පුද්ගලික ගණනෙහි අය පක්ෂයට තිබෙන ගණනට එක් එක් අවුරුද්දක් සඳහා ගෙවිය යුතුය.

එසේ වුවද --

(අ) සේවකයා දායක මුදල් ගෙවීමට පළමුවෙන් බැඳුණු අවුරුද්ද වෙනුවෙන් සේවකයකු විසින් හෝ සේවකයකු සම්බන්ධයෙන් මේ පනත යටතෙහි දායක මුදල් සඳහා එබඳු පොලියක් නො ගෙවිය යතුය.

(ආ) වෙළෙඳ පොළේ මිල අනුව අගය කිරීමේදී අරමුදලෙහි වත්කම්, අරමුදලෙහි වියදම් වලට වඩා සියයට දහයකින් වැඩි වුවහොත් මිස , ඒ පොලී ප්‍රමාණය අවුරුද්දකට සියයට දෙක හමාරකට වැඩි නොවිය යුතුය.

(ඇ) අරමුදලෙහි සාමාජිකයකුට හෝ සාමාජිකයකු වෙනුවෙන් මේ පනත යටතෙහි ප්‍රතිලාභයක් වශයෙන් යම් මුදලක් ගෙවනු ලැබූ ලිත් අවුරුද්දෙහි ජනවාරි මස 1 වෙනි දින සිට ආරම්භ වී ඒ මුදල ගෙවනු ලබන දිනයෙන් කෙළවර වන කාල පරිච්ඡේදය සඳහා, ඒ කාල පරිච්ඡේදය අවසාන වන දිනයෙහි දී ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට තිබෙන ගණන සම්බන්ධයෙන් අවුරුද්දකට සියයට දෙක හමාර ගණනේ පොලී ගෙවිය යුතුය.

(ඈ) තවද, යම් අවුරුද්දක ජුනි මස තිස් වෙනි දිනට පසු යම් දිනයක අරමුදලෙහි සාමාජිකයකුගේ පෞද්ගලික ගණනට මුදල් මණ්ඩලය විසින් 27 වෙනි වගන්තිය යටතෙහි යම් මුදල් එකතු කරනු ලැබූ අවස්ථාවක, එදින සිට ආරම්භ වී , ඒ අවුරුද්දෙහි දෙසැම්බර් මස තිස් එක් වෙනි දින කෙළවර වන කාල පරිච්ඡේදය සඳහා, ඒ මුදල සම්බන්ධයෙන් එබඳු යම් පොලියක් නොගෙවිය යුතුය.

(1) එම උපවගන්තියේ අතුරු විධිවිධානයෙහි (අ) සහ (ආ) ඡේද අත්හැරීමෙන් ;

(2) එම අතුරු විධිවිධානයේ (ඇ) සහ (ඈ) ඡේද එහි (අ) සහ (ආ) වශයෙන් නැවත අක්ෂරකරණයෙන් ; සහ 1970 අංක 16

(3) නැවත අක්ෂරකරණය කළ එම අතුරු විධිවිධානයේ (අ) ඡේදයේ ,-

(i)“ පොලියක් ” යන වචනයට “ අඩු නොවන එබඳු පොලියක් ” යන වචන ආදේශයෙන්, සහ

(ii) “අවසාන වන දින ” යන වචන නලට “අවසාන වන දිනට පූර්වයෙන් එළඹෙන මාසය අවසානයේ ” යන වචන

(2) මේ පනත යටතෙහි අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් සම්බන්ධයෙන් ගෙවිය යුතු පොලියෙහි යම් කොටසක් ගෙවීම සඳහා අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන අවස්ථාවක, අඩු ගණන ඒ සඳහා නියෝජිත මණ්ඩලය මගින් වෙන් කරන ලද මුදල්වලින් ගෙවිය යුතුය.

(3) මේ වගන්තියෙහි (2) වෙනි උප වගන්තිය යටතෙහි නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මගින් වෙන් කරන ලද යම් මුදලක් ආණ්ඩුවෙන් මුදල් මණ්ඩලයට දෙනු ලැබූ ණයක් විය යුතු ය . මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නිශ්චය කළ හැකි කොන්දේසි හා නියමයන් අනුව එය ආපසු ගෙවිය යුතුය.

15. මේ පනත අදාළ වන සේවකයකුගේ සේවා යෝජකයා විසින්, මේ පනත යටතෙහි එබඳු සේවකයකුගේ හැම මාසයක ම දායක මුදල ඒ සේවකයාගේ ඉපයීම්වලින් අඩු කොට ඊ ළඟ මාසයෙහි අන්තිම දිනයට පෙර අරමුදලට ගෙවිය යුතුය. එබඳු සේවකයකු වෙනුවෙන් එවැනි සේවා යෝජකයකු විසින් මේ පනත යටතෙහි අරමුදලට ගෙවනු ලැබූ දායක මුදලක් ඒ සේවකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ පරිදි සැලකිය යුතුය.

සේවකයන්ගෙන් ලැබිය යුතු දායක මුදල් ගෙවීම

16. යම් මාසයක් සම්බන්ධයෙන් මේ පනත යටතෙහි ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයෙහි අන්තිම දිනයට පෙර අරමුදලට නො ගෙවනු ලැබූ අවස්ථාවක, එවැනි දායක මුදල් නො ගෙවන ලද්දේ තමාගේ බලයෙන් පිට හේතු නිසා යයි කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි පැහැදිලි කිරීමට සේවා යෝජකයාට නොහැකි නම්, අය විය යුතු දායක මුදල් වල ගණනට අතිරේකව ඒ ගණනෙහි සියයට දහයක වැඩිපුර ගෙවීමක් ඒ දිනට පසු තිස් දිනක් ඇතුළත අරමුදලට ගෙවීමට ඔහු බැඳී සිටිය යුතු ය.

ප්‍රධාන පනතේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

7. ප්‍රධාන පනතේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ. :-

1971 අංක 08

නියමිත දිනයේදී දායක මුදල් ගෙවීමට අසමත්වූ විට සේවා යෝජකයන් මත අධිභාරයක්පැනවීම.

16. මේ පනත යටතේ යම් මාසයක් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දිනයට පෙර අරමුදලට ගෙවා නැත්තාවූද එම දායක මුදල් ගෙවීමට අසමත්වීම සේවායෝජකයාගේ පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත කරුණු නිසා සිදුවූවක් බව කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි පැහැදිලි කිරීමට සේවායෝජකයාට නොහැකි වූ ද අවස්ථාවක, අයවිය යුතු දායක මුදලට අතිරේකව පහත දැක්වෙන ආකාරයට ගණන් බලන ලද ගණනක වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතුය :-

(අ) දායක මුදල් එක් මාසයකට නොවැඩි කාලයක් හිඟව තිබෙන අවස්ථාවක, අයවිය යුතු දායක මුදලෙන් සියයට දහයක අධිභාරයකි ;

(ඇ) එම වගන්තියේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන් :-

"එසේ ද වුවත් අරමුදලේ සාමාජිකයකුට අවුරුදු පහකට එක් වරකට වඩා වැඩියෙන් ඔහුගේ පුද්ගල ගිණුමේ ඔහුගේ බැරට ඇති කිසියම් මුදලක් ආපසු ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

නියමිත දිනයෙහි දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අධිභාරයක් ගෙවීමට සේවා යෝජකයන්ට නියම කිරීම

16. යම් මාසයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අන්තිම දිනයට පෙර අරමුදලට නොගෙවනු ලැබූ ද, ඒ දායක මුදල් ගෙවීමට අපොහොසත් වූයේ නොවැළැක්විය හැකි හේතු නිසා බවට කොමසාරිස්වරයා සෑහීඹට පත්වන පරිදි පැහැදිලි කිරීමට සේවා යෝජකයාට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයට අතිරේකව පහත සඳහන් ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරයක් ඒ මුදල සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට සේවා යෝජකයා බැඳී සිටිය යුතු ය :-

(අ) දින දහයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අධිභාරයක්;

(ආ) දින දහයකට වැඩි වන නමුත් එක් මාසයකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) එක් මාසයකට වැඩි වන නමුත් මාස තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක අධිභාරයක්;

(ඈ) තුන් මාසයකට වැඩි වන නමුත් හය මාසයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) මාස හයකට වැඩි වන නමුත් මාස දොළහකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට හතලිහක අධිභාරයක් ;

(ඊ) මාස දොළහකට වැඩි කාලසීමාවක් සඳහා දායක මුදල් නොගෙවා ඇති අවස්ථාවක, අයවිය යුතු දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක අධිභාරයක් ;

17. අරමුදලට අය විය යුතු යම් මුදල් ආණ්ඩුවට අය විය යුතු ණයක් මෙන්, ලඝු ක්‍රමය අනුව පැවරිය හැකි නඩුවකින් අය කර ගත යුතුය. ක්‍රියා මාර්ගය ලඝු නඩුවලට අදාළ වන සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන මේ වගන්තිය යටතෙහි නඩුවකට අදාළ විය යුතුය . එබඳු නඩුවකට එබඳු විධිවිධාන යෙදීමේ කාර්යයන් සඳහා පමණක් ඒ සංග්‍රහයෙහි 8 වෙනි වගන්තිය, ඒ වගන්තියෙහි සඳහන් " මේ ආඥාපනතින් " යන වචන වෙනුවට " මේ ආඥාපනතින් හෝ අන් කිසි ලිඛිත නීතියකින් " යන වචන ආදේශ කරනු ලැබූවාක් මෙන් බල පෑ යුතුය. දායක මුදල් අය කර ගැනීම. 86 අධිකාරය

(2) කොමසාරිස්වරයා හෝ ඔහු වෙනුවෙන් බලය ලත් යම් නිලධරයකු විසින් අරමුදලට අය විය යුතු යම් මුදල් සම්බන්ධ නීති කටයුතු ඇරඹිය හැකිය. අන් කිසි ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුවද කොමසාරිස්වරයා හෝ ඒ නිලධරයා විසින් ඒ නීති කටයුතු ගෙන යා හැකිය.

55 අධිකාරය (3) මේ පනතෙහි වැඩිපුර ගෙවීම් හෝ දායක මුදල් වශයෙන් ගෙවිය යුතු යම් මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් කාලසීමා ආඥා පනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතුය.

සාමාජිකයන්ගේ පෞද්ගලික ගණන්වල අය පක්ෂයට එකතු කළ යුතු ගණන්

18. අරමුදලෙහි සාමාජිකයකුගේද ඔහු සම්බන්ධයෙන් සේවා යෝජකයාගේ ද දායක මුදල් හා ඒ දායක මුදල් සම්බන්ධ පොලිය ද මුදල් මණ්ඩලය විසින් ඒ සාමාජිකයාගේ පුද්ගලික ගණනෙහි අය පක්ෂයට එකතු කළ යුතුය.

සේවා යෝජකයා විසින් තමාගේ සේවකයන්ගේ ඉපයීම් අඩු කිරීම ආදිය තහනම් කිරීම

19. සේවකයකු සම්බන්ධයෙන්, මේ පනත යටතෙහි යම් දායක මුදලක් හෝ වැඩිපුර ගෙවීමක් සේවා යෝජකයකු විසින් ගෙවීමට බැඳී සිටීමේ හේතුවෙන් කිසිම සේවා යෝජකයකු විසින් ඒ සේවකයාගේ ඉපයීම් අඩු කිරීම හෝ අන් කිසි ලිඛිත නීතියක විධිවිධාන යටතෙහි හෝ ඒ සේවා යෝජකයා සමඟ ඔහුගේ වෘත්තීය කොන්දේසි යටතෙහි ඔහුට හිමි යම් ප්‍රතිලාභ ඔහුට හානි වන පරිදි වෙනස් කිරීම නොකළ යුතුය.

මේ පනත යටතෙහි සේවකයකු සම්බන්ධයෙන් සේවා යෝජකයාගෙන් අයවිය යුතු ගෙවීම් සේවකයාගේ ඉපයීම් වලින් සේවායෝජකයා විසින් අඩු කර ගැනීම තහනම්ය

20. මේ පනත යටතෙහි දායක මුදලක් හෝ වැඩිපුර ගෙවීමක් වශයෙන් සේවා යෝජකයකු විසින් ගෙවීමට බැඳී සිටින යම් ගණනක් යම් සේවකයකුගේ සේවා යෝජකයා විසින් ඒ සේවකයාගේ ඉපයීම් වලින් අඩු නොකළ යුතුය. මේ පනත යටතෙහි ඒ සේවා යෝජකයාගේ බැඳීමක යම් කොටසක් ඒ සේවකයාට පැවරුම් කරමින් ඒ සේවා යෝජකයා ඒ සේවකයා සමග කර ගනු ලැබූ යම් ගිවිසුමක් සම්පූර්ණයෙන් ශූන්‍ය විය යුතුය.

මේ පනත යටතෙහි සේවා යෝජකයකුගෙන් අය විය යුතු ගණන ඔහුගේ වත්කම් සම්බන්ධයෙන් පළමු වෙනි අය කිරීම විය යුතුය

21. මේ පනතින් සේවා යෝජකයකු විසින් මුදලක් ගෙවිය යුතු යයි නියමිත කාලසීමාව අවසාන වූ ඉක්බිතිව ම දිනයෙහි, මේ පනත යටතෙහි සේවා යෝජකයකුගෙන් අය විය යුතු යම් ගණනක් අන් කිසි ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුවද ඔහුගේ වත්කම් සම්බන්ධයෙන් පළමුවෙනි අය කිරීම විය යුතුය.

පෞද්ගලික ගණන්වල අය පක්ෂයට ඇති මුදල් අන්සතු කළ නොහැකි බව

82 අධිකාරය

22. අරමුදලෙහි සාමාජිකයකුගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට ඇති යම් මුදලක් සම්බන්ධ හැම පැවරීමක් හෝ අය කිරීමක් හා එවැනි ගණනක් පැවරීම හෝ අය කිරීම සම්බන්ධ සෑම ගිවිසුමක් ශූන්‍ය විය යුතුය . බලය ලත් අධිකරණයක් විසින් ඒ සාමාජිකයා වස්තු භංගත්වයට පත් වූ තැනැත්තකු වශයෙන් තීරණය කරනු ලැබූ අවස්ථාවක, වස්තු භංගත්ව ආඥා පනතෙහි විධිවිධාන කුමක් වුවද ඒ

සාමාජිකයාගේ ණය හිමියන් වෙනුවෙන් ක්‍රියා කරන කිසිම පැවරුම් ලාභියකුට එබඳු යම් මුදලක් නොලැබිය යුතුය.

1988 අංක 42 “ එසේ වුවද තවදුරටත්, 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටවනු ලැබූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් හෝ 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් හෝ (401 වන අධිකාරය වූ ) ජාතික නිවාස පනත යටතේ පිහිටවනු ලැබූ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව විසින් හෝ ( 397 වන අධිකාරය වූ ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව විසින් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් හෝ ( 124 වන අධිකාරය වූ ) සමූපකාර සමිති ආඥාපනත යටතේ පිහිටුවන ලද විවිධ සේවා සමූපකාර සමිති විසින් හෝ නිවාස ඉදිකිරීම් කාර්ය සඳහා දෙන ලද ණයකට ප්‍රතිපක්ෂව, අරමුදලේ සාමාජිකයකු විසින් , අරමුදලේ ස්වකීය පෞද්ගලික ගිණුමේ බැරට පවත්නා දායක මුදල් , එකී ණය දෙන ආයතන අතුරින් යම් ආයතනයකට පැවරීම හෝ වැය බරක් කිරීම හෝ කළ හැකිය.

කෙසේ වුවද, පවුලක එක සාමාජිකයකුට වඩා වැඩි සංඛ්‍යාවක් අරමුදලේ සාමාජිකයන් වන අවස්ථාවක, එසේ සාමාජිකයන් වන එම පවුලේ සියලුම සාමාජිකයන් විසින් අරමුදලේ සාමාජිකයන් වශයෙන් ඉහත කී පරිදි ගන්නා ලද නිවාස ණයකට ප්‍රතිපක්ෂව , ස්වකීය පෞද්ගලික ගිණුම්වල බැරට පවත්නා දායක මුදල්වල මුළු එකතු මුදල පැවරීම හෝ වැය බරක් කිරීම කල හැකිය.

ණය මුදලක වාරිකයක් ආපසු ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, මෙම පනතේ 23 වන හා 24 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද ඒ ගැන නොතකා, සේවකයා විසින් එසේ පැහැර හරිනු ලැබූ වාරිකය මත උපචිත වී ඇති පොලියද සමඟ ඒ වාරිකය, අදාළ ණය දෙන ආයතන විසින් ඒ බව දැනුම් දෙනු ලැබීමෙන් පසුව , එම සේවකයාගේ පෞද්ගලික ගිණුමෙහි හෝ සේවකයන්ගේ පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල්වලින් එම ණය දෙන ආයතනවලට කොමසාරිස්වරයා විසින් පියවිය යුතුය.

ණය මුදලක වාරික ගෙවීම සේවානියුක්තයකු විසින් පැහැර හැරීම පිළිබඳව අදාළ ණය දෙන ආයතනයන් විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දීම, එක් එක් ලිත් වර්ෂය අග දී කරනු ලැබිය යුතුය.

අවස්ථාවෝචිත පරිදි, 23 වන හෝ 24 වන වගන්තිය යටතේ වූ අර්ථ ලාභයක් ගෙවනු ලබන කල්හි , ඉහත කී පරිදි ගනු ලැබූ නිවාස ණයක් හේතු කොට ගෙන හිග මුදල් කිසිවක් ඇති අවස්ථාවක , අවස්ථාවෝචිත පරිදි එම සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ බැරට ඔහුගේ හෝ ඔවුන්ගේ පෞද්ගලික ගිණුම්වල පවත්නා මුදල් වලින් එම හිග මුදල් අඩුකොට, එසේ මුදල් අඩු කිරීමකට ඉක්බිතිවම, එසේ අඩුකර ගනු ලැබූ මුදල් අදාළ ණය දෙන ආයතනවලට පවරන ලෙස කොමසාරිස්වරයා විසින් මූල්‍ය මණ්ඩලයට නියම කළ හැකිය.

22 වන වගන්තියේ කාර්යය සඳහා “ පවුල ” යන්නෙන් අරමුදලේ සාමාජිකයෙකු, ඔහුගේ භාර්යාව හෝ ඇයගේ ස්වාමි පුරුෂයා, සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන් අදහස් වේ.

# III වෙනි කොටස

## ප්‍රතිලාභය

23. අරමුදලෙහි සාමාජිකයකුගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට ඇති මුළු ගණන -- ප්‍රතිලාභ ගෙවනු ලබන අවස්ථා

1971 අංක 08 (අ) " අරමුදලේ සාමාජිකයකු විසින් " යන වචන වෙනුවට " මේ වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සළස්වා ඇති පරිදි හැර අරමුදලේ සාමාජිකයකු විසින් " යන වචන ආදේශ කිරීමෙන්.

1985 අංක 01

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

1988 අංක 42

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර " යන වචන වෙනුවට "මෙම වගන්තියේ මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර හා 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම් වලට යටත්ව " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) ඒ සාමාජිකයා පිරිමියෙක් නම්, ඔහුට වයස අවුරුදු පනස් පහ සම්පූර්ණවීමෙන් හෝ ස්ත්‍රියක් නම් , ඇයට වයස අවුරුදු පනහ සම්පූර්ණ වීමෙන් පසු, හෝ

(ආ) ඒ සාමාජිකාව ස්ත්‍රියක් නම් , විවාහ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෘත්තියෙහි යෙදීම අවසන් වීමෙන් පසු, හෝ

(ඇ) සදහටම සම්පූර්ණයෙන් ම වැඩ කිරීමට නොහැකි තත්ත්වයකට පත්වීම නිසා ද ඒ හේතු කොට ගෙන තව ඉදිරියටත් වැඩ කිරීමට නුසුදුසු බවට ලියාපදිංචි කළ වෛද්‍යවරයකු විසින් සහතික කරනු ලැබීමෙන් ද එවැනි සාමාජිකයකු වෘත්තියෙහි යෙදීම අවසන් වීමෙන් පසු , හෝ

(ඈ) ඒ සාමාජිකයා ලංකාවෙන් බැහැර යන්නේ ලංකාවට ආපසු නොඑන අදහසින් බව ලියවිල්ලකින් ප්‍රකාශ කරන්නේ නම් , ඒ සාමාජිකයා ලංකාවෙන් බැහැර යන දිනයට පෙර,

හැකි තාක් ඉක්මනින් අරමුදලෙහි සාමාජිකයාට ගෙවිය යුතු ය.

1971 අංක 08 (ආ) (ඇ) ඡේදයේ " දිනට පෙර " යන වචනය වෙනුවට " දිනට පෙර, හෝ " යන වචන ආදේශ කිරීමෙන් ;

1971 අංක 08 (ඉ) එම සාමාජිකයා ආවරණය වූ සේවානියුක්තියක සේවයේ නියුක්තව සිටීම නතරවීමෙන් පසුව රාජ්‍ය සේවයේ හෝ 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තියක් භාරගත් විට ; " සහ

1985 අංක 01 (2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ඉ) ඒ සාමාජිකයා ආරක්ෂිත සේවා නියුක්තියක සේවයේ යෙදී සිටීම අවසන් වී විශ්‍රාම වැටුප් සහිත පහත සඳහන් සේවයක නියුක්ත වීමෙන් පසු --

(i) රජයේ සේවයේ ;

(ii) 1974 අංක 16 දරන පලාත් පාලන සේවා පනතින් පිහිටුවනු ලැබූ පලාත් පාලන සේවාවෙහි;

(iii) 1980 අංක 3 දරන සංවර්ධන සභා පනතේ 47 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් සේවයෙහි;

(iv) පලාත් පාලන සේවයෙහි සාමාජිකයකු ලෙස හැර යම් පලාත් පාලන ආයතනයක සේවයෙහි. ''

(1) එහි (ඉ) ඡේදයෙහි '' සේවා නියුක්තියක් භාරගත් පසු '' යන වචන වෙනුවට '' සේවා නියුක්තියක් භාරගත් පසු ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

1992 අංක 14

(2) එහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන් :-

(ඊ) (i) 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මගින් , යම් ව්‍යාපාර ආයතනයක් බාර ගැනීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා, රාජ්‍ය සංස්ථාවක් පිහිටුවන ලද විට, ඒ සාමාජිකයා එම ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ඒ සාමාජිකයා එසේ පිහිටු වන ලද රාජ්‍ය සංස්ථාවේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු;

(ii) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සංස්ථාවක කර්තව්‍ය බාරගැනීම සඳහා හෝ ව්‍යාපාර ආයතනයක් බාරගැනීම හා කරගෙන යාම සඳහා පොදු සමාගමක් සංස්ථාගත කරන ලද විට , අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයා එම රාජ්‍ය සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු සහ ඒ සාමාජිකයා එසේ සංස්ථාගත කරන ලද පොදු සමාගමේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු;

(iii) සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා ඒ සාමාජිකයා ඉවත් කරන ලද විට , ඒ සාමාජිකයා රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ;

(iv) යම් රාජ්‍ය සංස්ථාවක් විසුරුවා හැරීමෙන් පසු හෝ යම් රාජ්‍ය සංස්ථාවක් ව්‍යාපාර ආයතනය වසා දැමීමෙන් පසු ඒ සාමාජිකයා ඒ රාජ්‍ය

සංස්ථාවේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ; ”

එසේ වුවද අරමුදලෙහි සාමාජිකයා පිරිමියෙක් නම්, වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ වීමෙන් පසු රක්ෂිත වෘත්තියක ඔහු තව දුරටත් වැඩ කරන අවස්ථාවක හෝ ස්ත්‍රියක නම් , වයස අවුරුදු පනහ සම්පූර්ණ වීමෙන් පසු රක්ෂිත වෘත්තියක ඇය තවදුරටත් වැඩ කරන අවස්ථාවක, ඒ සාමාජිකයා හෝ සාමාජිකාව ඒ වෘත්තියෙහි යෙදීම අවසන් කරන තුරු මේ වගන්තියෙහි පෙරාතුව සඳහන් විධිවිධාන යටතෙහි ගෙවීමට හිමි නො විය යුතු ය.

1971 අංක 08 “ එසේ ද වුවත් අරමුදලේ සාමාජිකයකුට අවුරුදු පහකට එක් වරකට වඩා වැඩියෙන් ඔහුගේ පුද්ගල ගිණුමේ ඔහුගේ බැරට ඇති කිසියම් මුදලක් ආපසු ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතුය. ”

1985 අංක 01 “ (2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සාමාජිකයකු විසින් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය සහතිකයක සත්‍යතාවය පිලිබඳව කම්කරු කොමසාරිස්වරයාට සැක කිරීමට හේතුවක් ඇති වූ අවස්ථාවකදී, කොමසාරිස්වරයා විසින් අදාළ සාමාජිකයා නිසි පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු විසින් නැවත පරීක්ෂා කිරීම සඳහා යොමු කළ හැකි අතර එසේ නැවත පරීක්ෂා කරනු ලැබීමේදී මුලින් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය සහතිකයෙහි සඳහන් යම් වැදගත් කරුණක් අසත්‍ය බවට සොයා ගනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් ඒ වෛද්‍ය සහතිකය ප්‍රතික්ෂේප කළ යුතු අතර ඒ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් අනාගතයේදී ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික පිලි නොගැනීමට කොමසාරිස්වරයාට හිමිකම් තිබිය යුතු ය. ”

(3) එහි අවසාන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

1992 අංක 14 “ මේ වගන්තියෙහි --

(i) “ ව්‍යාපාර ආයතනය ” යන්නෙන් 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගත් හෝ ආණ්ඩුව වෙත සතු වූ යම් ව්‍යාපාර ආයතනයක් අදහස් වේ;

(ii) “ රාජ්‍ය සංස්ථා ” යන්නෙහි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය;

(iii) “ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා ” යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෛද්‍ය වෘත්තිකයෙක් අදහස් වේ;

(iv) “සේවක සංඛ්‍යාව අඩු කිරීම ” යන්නෙහි, කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය. ”

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 23 අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :-

ප්‍රධාන ප්‍රඥප්තියට 23 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

2012 අංක 02

" නිවාස ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ප්‍රතිලාභ "

23 අ. (1) (අ) වසර දහයකට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා ඇති ;

(ආ) දැනට සේවයේ නියුක්තව සිටින; සහ

(ඇ) ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් ඇති,

අරමුදලේ සෑම සාමාජිකයකුම --

(I) නිවාස කාර්යය සඳහා ; හෝ

(II) වෛද්‍ය ප්‍රතිකාරවල කාර්යය සඳහා,

ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදලින් සියයට තිහක් නොඉක්මවන ප්‍රතිශතයක් ආපසු ගැනීමට හිමිකම් ඇත්තේ ය;

එසේ වුව ද , අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයේ යහපත පිණිස , එවැනි පෞද්ගලික ගිණුමකින් ආපසු ගත හැකි උපරිම මුදල් ප්‍රමාණය, කලින් කල , නියම කරනු ලැබිය හැකිය.

(2)(1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඔහුගේ ගිණුමේ, ඔහුගේ බැරට ඇති මුදලින් යම් මුදලක් ආපසු ලබා ගන්නා අරමුදලේ සාමාජිකයකුට, එසේ ආපසු ලබාගැනීමේ දින සිට අවුරුදු දහයක කාල සීමාවක් සම්පූර්ණ වීමෙන් පසු (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව එකී ගිණුමෙන් දෙවන වරට සියයට තිහක ප්‍රතිශතයක් නොඉක්මවන මුදලක් ඉහත කාර්යවලින් යම් කාර්යයක් සඳහා ආපසු ලබාගැනීමට හිමිකමක් ඇත්තේය.

(3) සෑම සාමාජිකයකුට ම අරමුදලේ දායකයකු වශයෙන් සිටින කාලය තුළදී තම පෞද්ගලික ගිණුමෙන් අවස්ථා දෙකක දී පමණක් මුදල් ආපසු ලබා ගැනීමට හිමිකම ඇත්තේය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා --

" නිවාස " යන්නට, ඒ සාමාජිකයා විසින් --

(අ) සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම;

(ආ) නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම;

(ඇ) නිවාස දේපලක් මිලදී ගැනීම;

(ඈ) නිවාස දේපලක් මත ඇති උකසක් බේරුම් කිරීම ; හෝ

(ඉ) අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම.

ඇතුළත් වේ. සහ
" වෛද්‍ය ප්‍රතිකාර " යන්නට --

(අ) හෘදය සැත්කම ;

(ආ) බයිපාස් සැත්කම ;

(ඇ) සැත්කම් ඇතුළුව පිළිකා සඳහා ප්‍රතිකාර ;

(ඈ) වකුගඩු බද්ධ කිරීම හෝ සැත්කම් ;

(ඉ) සිසේරියන් සැත්කම ; හෝ

(ඊ) අනතුරක් සිදුවීම හේතු කොටගෙන දින දාහතරකට නොඅඩු කාලයක් රෝහල් ගතව සිටීම.

ඇතුළත් වේ.

(5) මේ වගන්තියේ සඳහන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අරමුදලේ සාමජිකයාට ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන්ට හිමිකම් ඇත්තේ ය.

(6) (1) වන උපවගන්තියේ (i) වන හෝ (ii) වන අනුඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු එකිනෙකට වෙනස් දින අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යම් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකිය. "

ඇතැම් අවස්ථාවන්හි ප්‍රතිලාභ ගෙවිය යුත්තේ කවර තැනැත්තන් හට ද යන බව

24. අරමුදලෙහි සාමාජිකයකු, තමාගේ පෞද්ගලික ගණනෙහි තමාගේ අය පක්ෂයට තිබෙන ගණනට හිමිකමක් ලැබීමට පෙර, මිය යන අවස්ථාවක හෝ එයට හිමිකම ලැබුණේ වී නමුදු ඒ ගණන ලැබීමට පෙර ඔහු මිය යන අවස්ථාවක, හෝ එවැනි සාමාජිකයකු මිය ගිය විට මේ පනත යටතෙහි සම්පාදිත නියෝගය යටතෙහි ඒ මුදල් ගෙවිය යුතු යයි නම් කරනු ලැබූ තැනැත්තකු පත් කරනු නොලැබූ අවස්ථාවක හෝ, නම් කරනු ලැබූ එක් තැනැත්තකු පත් කරනු ලැබ , ඔහු මිය ගිය අවස්ථාවක හෝ නම් කරනු ලැබූ තැනැත්තන් එක් කෙනෙකුට වඩා පත් කරනු ලැබ, ඔවුන්ගේ යම් කෙනකු මිය ගිය අවස්ථාවක ඒ ගණන --

(අ) රුපියල් දෙදහස් පන්සියයට නො අඩු නම් , අන්තිම කැමති පත්‍රයෙහි කාර්යාධිකාරීට හෝ ඒ බූදලයට අන්තර්ගත කළ යුතු ඒ මිය ගිය සාමාජිකයාගේ බූදලයෙහි පරිපාලකයාට ගෙවිය යුතුය.

(ආ) එය රුපියල් දෙදහස් පන් සියයට අඩු නම්, නීතිය අනුව ඒ ගණනට හිමිකමක් තිබේ යයි කොමසාරිස්වරයාගේ මතය අනුව සහතික කරනු ලබන තැනැත්තන් අතුරෙන්

මුදල් මණ්ඩලය විසින් වෙන් කරනු ලැබූ හෝ වෙන් කරනු ලැබිය හැකි තැනැත්තාට ගෙවිය යුතුය.

1971 අංක 08

(1) එම වගන්තිය 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) එසේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ --

(අ) " පෙර මියයන අවස්ථාවක හෝ නාමිකයකු " යන වචන වෙනුවට " පෙර මිය යන අවස්ථාවක සහ නාමිකයකු " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) " එක් නාමිකයකු පත්කර ඇති අවස්ථාවක " යන වචනවල සිට " එවිට එම මුදල් " යන වචන දක්වා ඇති වචන වෙනුවට " මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ පත් කරන ලද නාමිකයා හෝ නාමිකයන් මියගොස් ඇති අවස්ථාවක එම මුදල;" යන වචන ආදේශ කිරීමෙන්;

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1988 අංක 42

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ " එවිට එම මුදල " යන වචන වෙනුවට " එවිට 22 වන වගන්තියෙන් කර ඇති අඩු කිරීම්වලට යටත්ව ; එම මුදල " යන වචන ආදේශ කිරීමෙන් ;

1971 අංක 08

(2) සාමාජිකයකු මිය ගිය විට ඔහුගේ පුද්ගල ගිණුමේ ඇති මුදල් ගෙවනු ලැබිය යුතු නාමිකයන් දෙදෙනකු හෝ වැඩි ගණනක් මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ එම සාමාජිකයා විසින් පත් කර ඇති අවස්ථාවක, සහ එම සාමාජිකයාට කලින් නාමිකයා හෝ නාමිකයන් එක් කෙනෙකුට වැඩි ගණනක් මියගිය අවස්ථාවක, ඉහත කී නියෝග යටතේ අලුත් පත් කිරීමක් නොකර එම සාමාජිකයා මියගිය විට එම මුදල --

(අ) ජීවත්ව සිටින නාමිකයකු වේ නම් ඔහුට ගෙවනු ලැබිය යුතුය ; නැතහොත්

(ආ) නාමිකයන් එක් කෙනෙකුට වැඩි ගණනක් සිටී නම් නාමිකයන් අතර සමාන කොටස් වලින් බෙදා දිය යුතුය. "

" ප්‍රතිලාභය " යන්න විස්තර කිරීම

25. 23 වෙනි වගන්තිය හා 24 වෙනි වගන්තිය යටතෙහි තැනැත්තකුට හිමි වූ හෝ මේ පනත යටතෙහි සම්පාදිත නියෝග යටතෙහි අරමුදලෙහි සාමාජිකයකු විසින් පත් කරනු ලැබූ නම් කළ තැනැත්තකුට හිමි වූ යම් මුදලක්, ඒ සාමාජිකයාගේ මරණයෙන් පසු, මේ පනතෙහි ප්‍රතිලාභයක් වශයෙන් සඳහන් කරනු ලැබේ.

අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම

26. මේ පනත යටතෙහි ප්‍රතිලාභයකට යම් තැනැත්තකුගේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඔහු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් නියමිත අන්දමට ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම කොන්දේසියක් විය යුතුය.

## IV වෙනි කොටස
## අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම

අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම

27. (1) රක්ෂිත වෘත්තියක සේවකයන්ගේ යහපත සඳහා නියමිත දිනයට පෙර අර්ථසාධක අරමුදලක් හෝ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කර තිබෙන අවස්ථාවක, මේ පනත යටතෙහි සම්පාදිත නියෝග මගින් ඒ වෘත්තීය රක්ෂිත වෘත්තියක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු, මාස තුනක් ඇතුළත ඒ අරමුදලෙහි හෝ ක්‍රමයෙහි හෝ පරිපාලකයන් විසින්, ඒ අරමුදල හෝ ක්‍රමය සම්බන්ධ නියමිත විස්තර කොමසාරිස්වරයාට සැපයිය යුතුය. තව ද තමාට අවශ්‍ය යැයි හැගෙන පරිදි එවැනි කරුණු පරීක්ෂා කිරීමෙන් හා එවැනි විමර්ශන පැවැත්වීමෙන් පසු ඒ අරමුදල හෝ ක්‍රමය නියමිත සුදුසුකම් සපුරාලන බවද ඒ අරමුදල හෝ ක්‍රමය අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් විය යුතු යයි ප්‍රකාශ කළ යුතු බවද අවස්ථාවෝචිත යයි කොමසාරිස්වරයාගේ මතය නම්, ඒ අරමුදල හෝ ක්‍රමය අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් විය යුතු යයි ඔහු විසින් ප්‍රකාශ කළ යුතුය . තවද, ඔහු එසේ ප්‍රකාශ කරන්නේ නම් , ඒ අරමුදල හෝ ක්‍රමය සම්බන්ධයෙන් නියම කරනු ලැබූ දිනයෙහි සිට ඒ සේවකයන් හා ඒ සේවකයන්ගේ සේවා යෝජකයන් විසින් අරමුදලට කිසි දායක මුදලක් නො ගෙවිය යුතුය.

(2) නියම කරනු ලැබූ දිනයට පසු , රක්ෂිත වෘත්තියක සේවකයන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීමට බලාපොරොත්තු වන ඒ වෘත්තියෙහි සේවා යෝජකයා විසින් යෝජිත අරමුදල සම්බන්ධ නියමිත විස්තර කොමසාරිස්වරයාට සැපයිය යුතුය. තවද තමාට අවශ්‍ය යයි හැගෙන පරිදි එවැනි කරුණු පරීක්ෂා කිරීමෙන් හා එවැනි විමර්ශන පැවැත්වීමෙන් පසු යෝජිත අර්ථසාධක අරමුදල නියමිත සුදුසුකම් සපුරාලන බවද ඒ අරමුදල අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් විය යුතු යයි ප්‍රකාශ කළ යුතු බවද අවස්ථාවෝචිත යයි කොමසාරිස්වරයාගේ මතය නම්, යෝජිත අරමුදල අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් විය යුතු යයි කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කළ යුතුය. ඔහු එසේ ප්‍රකාශ කොට, අර්ථසාධක අරමුදල ද පිහිටවනු ලැබුවහොත්, අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන දිනයෙහි පටන්, ඒ සේවකයන් හා සේවා යෝජකයන් විසින් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම අවසාන විය යුතුය.

1985 අංක- 01

(2 අ) සේවායෝජකයන් හෝ යම් අනුමත අර්ථ අරමුදලක හෝ අනුමත දායක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක පරිපාලකවරයන් හෝ විසින් යම් මාසයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දින හෝ එදිනට පෙර එම අරමුදලට හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවනු නොලැබ ඒ දායක මුලද් ගෙවීම පැහැර හැරීම සිදුවූයේ තමාට පාලනය කිරීමට නොහැකි හේතු කරන කොට ගෙන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන සේ පහදා දීමට එම සේවායෝජකයාට හෝ පරිපාලකවරයාට නොහැකි නම් , ගෙවියයුතු දායක මුදල් ප්‍රමාණයට අමතරව පහත දැක්වෙන ආකාරයට එම මුදල් ප්‍රමාණය මත ගණන් බලනු ලැබූ අධිභාරයක් ද ඒ අරමුදලට හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවීමට ඔහු යටත් විය යුතු ය :-

(අ) දින දහයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට පහක අධිභාරයක් ;

(ආ) දින දහයක් ඉක්ම වූ එක් මාසයක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට පහලොවක අධිභාරයක් ;

(ඇ) එක් මාසයක් ඉක්ම වූ එහෙත් මාස තුනක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) මාස තුනක් ඉක්ම වූ එහෙත් මාස හයක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) මාස හයක් ඉක්ම වූ එහෙත් මාස දොලහක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට හතලිහක අධිභාරයක් ; සහ

(ඊ) මාස දොලහක් ඉක්ම වූ කාල සීමාවක් සඳහා දායක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී ගෙවීමට ඇති දායක මුදල්වලින් සියයට පනහක අධිභාරයක් .

(2 ආ) අධිභාර ලෙස ලැබ යම් අනුමත අර්ථ සාධක අරමුදලක හෝ අනුමත දායක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක හෝ අරමුදලට ගෙවනු ලැබූ මුදල්, අවස්ථාවෝචිත පරිදි, එම අරමුදලේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආදායමෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එම අරමුදලේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයන් අතර බෙදනු ලැබිය යුතු ය.

(3) අනුමත කරන ලද අර්ථ සාධක අරමුදලක් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් පාලනය කෙරෙන ව්‍යවස්ථා හෝ නියෝග කොමසාරිස්වරයාගේ ලිපිගත අනුමතිය ඇති ව මිස වෙනස් නො කළ යුතුය. මේ උප වගන්තියෙහි විධිවිධාන කඩ කරනු ලැබූ අවස්ථාවක ඒ අරමුදලෙහි හෝ ක්‍රමයෙහි පරිපාලකයන් විසින් ඒ කඩ කිරීම කරන ලද බව සැලකිය යුතුය.

(4) අනුමත කරන ලද අර්ථසාධක අරමුදලකට හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයකට හෝ ඒ අරමුදල හෝ ක්‍රමය සම්බන්ධයෙන් වලංගු වන ව්‍යවස්ථා හෝ නියෝග යටතෙහි දායක මුදල් ගෙවීමට බැඳී සිටින හැම සේවා යෝජකයකු හා සේවකයකු විසින් , ඔවුන්හට අදාළ වන ව්‍යවස්ථා හෝ නියෝග අනුව ක්‍රියා කළ යුතුය.

(5) මේ පනත යටතෙහි සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට බැඳී සිටින සේවකයකු , අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් පවතින වෘත්තියක සේවයෙහි යෙදීම හේතු කොට ගෙන හෝ මේ වගන්තියෙහි (2) වෙනි උප වගන්තියෙහි නියමිත කරුණු නිසා සේවකයකු සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම අවසාන වන අවස්ථාවක සේවක අර්ථසාධක අරමුදලෙහි ඔහුගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට තිබෙන ගණන මේ පනතෙහි III වෙනි කොටසෙහි විධිවිධාන අනුව වැය කිරීම සඳහා ඒ ගණනෙහි තබා ගත යුතුය.

(6) අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් වසා දැමූ අවස්ථාවක අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදලට ගෙවනු ලැබූ සියලු දායක මුදල් හා ඒ සම්බන්ධ පොලිය , අනුමත කරන ලද ඒ අර්ථසාදක අරමුදලෙහි පරිපාලකයන් හා වසා දමන්නන් විසින් සේවක අර්ථසාධක අරමුදලට පැවරිය යුතුය.

(7) අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක දායකයකු වූ යම් සේවකයකු ඔහු එසේ දායකයකු වීමට හේතු වූ වෘත්තියෙන් අස් වී අනුමත කරන ලද අන් කිසි අර්ථසාධක අරමුදලකට දායක වීමට තමන් කෙරෙහි බැඳීමක් නැති රක්ෂිත වෘත්තියක ඉන් පසු ව යෙදී ඒ රක්ෂිත වෘත්තියෙහි වැඩ භාර ගත් බව ලියවිල්ලකින් කොමසාරිස්වරයාට දැනුම් දුන් විට , පළමු සඳහන් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලට, ඒ සේවකයා වෙනුවෙන් ගෙවනු ලැබූ සියලු දායක මුදල් හා එහි පොලී සේවක අර්ථසාධක අරමුදලට පැවරීමට පළමු සඳහන් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලෙහි පරිපාලකයන්හට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් නියම කළ යුතුය.

(8) මේ වගන්තියෙහි (1) වෙනි උප වගන්තියෙහි සඳහන් අර්ථසාධක අරමුදලක හෝ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක පරිපාලකයන් ඒ උප වගන්තියෙහි විධිවිධාන අනුව ක්‍රියා නොකරන අවස්ථාවක හෝ එබඳු අරමුදලක් හෝ ක්‍රමයක් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් යයි කොමසාරිස්වරයා විසින් අනුමත කරනු නොලැබූ අවස්ථාවක, පළමු සඳහන් අර්ථසාධක අරමුදලට හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට සේවකයන් වෙනුවෙන් ගෙවනු ලැබූ සියලු දායක මුදල් හා එහි පොලී ඒ පරිපාලකයන් විසින් අරමුදලට පැවරිය යුතු ය.

(9) මුදල් මණ්ඩලය විසින් --

(අ) අනුමත කරන ලද අර්ථසාධක අරමුදලකින් මේ වගන්තියෙහි (6) වෙනි උප වගන්තිය යටතෙහි මුදල් ගණනක් සේවක අර්ථසාධක අරමුදලට පවරනු ලැබූ අවස්ථාවක එසේ පවරනු ලැබූ අවස්ථාවෙහි අනුමත කරන ලද අර්ථසාධක අරමුදලෙහි දායකයන් වූ සෑම සේවකයකු සඳහා ම සේවක අර්ථසාධක අරමුදලෙහි පෞද්ගලික ගණනක් ආරම්භ කළ යුතුය. අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදලේ ඔහුගේ ගණනෙහි අය පක්ෂයට තිබී, සේවක අර්ථසාධක අරමුදලට පවරනු ලැබූ ඒ කොටස සේවක අර්ථසාධක අරමුදලෙහි එවැනි හැම සේවකයකුගේම පුද්ගලික ගණනෙහි අය පක්ෂයට එකතු කළ යුතු ය;

(ආ) තවද, මේ වගන්තියෙහි (7) වෙනි උප වගන්තිය හෝ (8) වෙනි උප වගන්තිය යටතෙහි සේවක අර්ථසාධක අරමුදලට යම් මුදලක් පවරනු ලැබූ හැම සේවකයකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලෙහි පුද්ගලික ගණනක් ආරම්භ කළ යුතුය.

(10) අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත් නොවූ අවස්ථාවක , ඒ අරමුදල හෝ ක්‍රමය සම්බන්ධයෙන් මේ වගන්තියෙහි (1) වෙනි උප වගන්තිය හෝ (2) වෙනි උප වගන්තිය යටතෙහි කරන ලද ප්‍රකාශය ඔහු විසින් අවලංගු කළ හැකිය. එබඳු ප්‍රකාශයක් අවලංගු කරනු ලැබුවහොත්, ඔහු විසින් --

(අ) ඒ අරමුදලෙහි හෝ ක්‍රමයෙහි පරිපාලකයන්හට අවලංගු කිරීම, ලියවිල්ලකින් දැනුම් දිය යුතුය ;

(ආ) තවද, ඒ අරමුදලට හෝ ක්‍රමයට ගෙවනු ලැබූ සියලු දායක මුදල් හා ඒ එහි පොලිය සේවක අර්ථසාධක අරමුදලට පැවරීමට පරිපාලකයන්හට නියම කළ යුතුය;

ඒ පරිපාලකයන් කොමසාරිස්වරයාගේ නියමය අනුව ක්‍රියා කළ යුතු ය.

(11) අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක පරිපාලකයන් විසින් මේ වගන්තියේ (10) වෙනි උප වගන්තිය යටතෙහි කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ නියමයක් අනුව ක්‍රියා කරනු ලැබූ අවස්ථාවක , ඒ පරිපාලකයන් ඒ නියමය ඉෂ්ට කරනු ලැබූ අවස්ථාවෙහි අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදල හෝ අනුමත කරන ලද විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක වූ හැම සේවකයකු වෙනුවෙන් මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි පුද්ගලික ගණනක් ආරම්භ කළ යුතුය . අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදලෙහි හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ඒ සේවකයාගේ ගණනෙහි අය පක්ෂයෙහි වූ ද, අනුමත කරන ලද ඒ අර්ථසාධක අරමුදලෙන් හෝ අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් සේවක අර්ථසාධක අරමුදලට පවරනු ලැබූ ඒ මුදල් කොටස ඒ පුද්ගලික ගණනට එකතු කළ යුතුය.

1985 අංක- 01

(12) අවස්ථාවෝචිත පරිදි සේවා යෝජකයකු හෝ පරිපාලකයකු සහ අනුමත අර්ථ සාධක අරමුදලක හෝ අනුමත දායක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක යම් සාමාජිකයකු අතර ආරවුලක් ඇති බව කොමසාරිස්වරයාට දැනුම් දී ඇති අවස්ථාවක, ඒ ආරවුල සමථයකට පත් කිරීම සඳහා අවස්ථානුකූලව සුදුසු යයි කොමසාරිස්වරයා සලකන විධාන ඔහු විසින් නිකුත් කළ යුතු ය . මේ උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධාන ආරවුලට සම්බන්ධ පාර්ශවයන් කෙරෙහි අනුගමා වේ.

## V වෙනි කොටස

## ඉල්ලීම් නිශ්චය කිරීම

කොමසාරිස් වරයා හෝ කොමසාරිස්වරයා විසින් බල පවරනු ලැබූ නිලධරයකු ඉල්ලීම් නිශ්චය කිරීම

28. ප්‍රතිලාභ සම්බන්ධ සියලු ඉල්ලීම් කොමසාරිස් වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ ඕනෑ ම නිලධරයකු විසින් නිශ්චය කළ යුතුය . කොමසාරිස්වරයාගේ හෝ ඒ නිලධරයාගේ විනිශ්චය, මේ පනතෙහි විධිවිධාන අනුව එබඳු විනිශ්චයකට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ ආයාචනයක් සම්බන්ධ යම් තීරණයකට යටත් ව අවසාන විනිශ්චයක් විය යුතුය.

එසේ වුවද මේ වගන්තිය යටතෙහි යම් නිලධරයකු විසින් කරන ලද යම් විනිශ්චයක්, කොමසාරිස්වරයා විසින් ස්වකීය යෝජනාව පිට නියමිත කාල පරිච්ඡේදය තුළ නැවත සලකා බැලිය හැකිය . එවැනි අවස්ථාවක කොමසාරිස්වරයාගේ විනිශ්චය 29 වෙනි වගන්තියෙහි කාර්යයන් සඳහා , ඒ කාරණය සම්බන්ධ විනිශ්චය වශයෙන් සැලකිය යුතුය.

29. (1) 28 වෙනි වගන්තිය යටතෙහි කරනු ලැබූ යම් විනිශ්චයකින් නොසතුටට පත් යම් කෙනකු විසින් ඒ විනිශ්චයට විරුද්ධව (මේ පනතෙහි මින් පසු විනිශ්චය සභාව වශයෙන් හැඳින්වෙන ) නියමිත පරිදි සංස්ථාපිත ආයාචන විනිශ්චය සභාවට ආයාචනය කළ හැකිය . ඒ ආයාචනය සම්බන්ධ විනිශ්චය සභාවෙහි තීරණය , මේ වගන්තියේ (2) වෙනි උප වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව එබඳු තීරණයකට විරුද්ධව කරන ලද ආයාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් කළ හැකි යම් ආඥාවකට යටත් ව, අවසාන තීරණය විය යුතුය. ආයාචනා

(2) කොමසාරිස්වරයා හෝ විනිශ්චය සභාවට ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ යම් පාර්ශ්වයක් ඒ ආයාචනා පිළිබඳ විනිශ්චය සභාවෙහි තීරණය සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ අවස්ථාවක , කොමසාරිස්වරයා හෝ ඒ පාර්ශ්වය විසින්, ආයාචනයට සම්බන්ධ අනෙක් සෑම පාර්ශ්වයක් ම වග උත්තරකරුවකු වශයෙන් සඳහන් කරනු ලැබූ ලිපිගත පෙත්සමක මාර්ගයෙන්, ඒ තීරණයට විරුද්ධව නීති ප්‍රශ්නයක් පිට ශ්‍රේෂ්ඨාධිකරණයට ආයාචනය කළ හැකිය. විවාද කළ යුතු නීති ප්‍රශ්නය ආයාචනා පෙත්සමෙහි දැක්විය යුතුය . ඒ ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විනිශ්චය කිරීමට සුදුසු බවට අධිනීතිඥයකුගෙන් හෝ නීතිඥයකුගෙන් සහතිකයක් ද එ සමග තිබිය යුතුය. යම් තීරණයකට විරුද්ධව ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබුවේද විනිශ්චය සභාවේ ඒ තීරණයෙහි දිනයට පසු , දින විසි එකක් තුල ආයාචක විසින් පෙත්සම විනිශ්චය සභාවට ඉදිරිපත් කළ යුතුය . වග උත්තරකරුවන් වශයෙන් සඳහන් කරනු ලැබූ එක් එක් තැනැත්තකුට භාරදීම සඳහා සෑහෙන පිටපත් ගණනක් ඒ සමග එවිය යුතුය. එබඳු එක් එක් ආයාචනා පෙත්සමක් නියමිත ගාස්තුවක් සමග එවිය යුතුය.

(3) මේ වගන්තියේ (2) වෙනි උපවගන්තියෙහි නියමිත අන්දමට හා කාලය තුළ විනිශ්චය සභාවට ආයාචනා පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක --

(අ) යම් තීරණයකට විරුද්ධව පෙත්සම ඉදිරිපත් කරන ලද්දේ ද විනිශ්චය සභාව මගින් කළ ඒ තීරණයෙහි නීති කටයුතුවල වාර්තාවක් සමග පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම , හා

(ආ) ආයාචනා පෙත්සමෙහි නම් කරන ලද එක් එක් වග උත්තරකරුවකුට ආයාචනය සම්බන්ධ දැන්වීම හා ආයාචනා පෙත්සමෙහි පිටපතක් භාර දෙනු ලැබීමට සැලැස්වීම

විනිශ්චය සභාවෙහි යුතුකම විය යුතු ය.

(4) මේ වගන්තිය යටතෙහි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලබන සෑම ආයාචනයක්ම ඒ අධිකරණයෙහි යම් විනිශ්චයකාරයකු විසින් විමසා නිශ්චය කළ හැකිය.

(5) මේ වගන්තිය යටතෙහි යම් ආයාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තීරණයක් දීමෙන් පසු ඒ අධිකරණයෙහි ලේඛකාධිකාරී විසින් ඒ අධිකරණයෙහි තීරණයක් සමග විනිශ්චය සභාවට නඩුව එවිය යුතුය. ඒ අධිකරණයෙහි තීරණයෙන් අවශ්‍ය වේ නම් විරුද්ධව ආයාචනය කරනු ලැබූ විනිශ්චය සභාවෙහි ඒ තීරණය , ඒ අධිකරණයෙහි තීරණයෙන් නියමිත අන්දමට අවලංගු කිරීම හෝ වෙනස් කිරීමද ඒ අධිකරණයෙහි තීරණය ක්‍රියාත්මක කිරීමෙහි කාර්යය සඳහා අවශ්‍ය අවස්ථාවක අලුත් තීරණයක් කිරීමද විනිශ්චය සභාවෙහි යුතුකම විය යුතුය.

(6) මෙ වගන්තිය යටතෙහි ශ්‍රේෂ්ඨාධිකරණයට කරනු ලැබූ යම් ආයාචනයකදී ගාස්තු සම්බන්ධයෙන් ඒ අධිකරණයට සුදුසු යයි හැගෙන අන්දමේ නියෝගයක් ඒ අධිකරණය මගින් කළ හැකිය.

(7) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යයි මේ වගන්තියෙහි (6) වෙනි උප වගන්තිය යටතෙහි ශ්‍රේෂ්ඨාධිකරණය මගින් නියම කරනු ලැබූ යම් ගාස්තුවක්, සුලු අපරාධ අධිකරණයෙහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාවෙහි යෙදවීමේ දී ඒ අධිකරණය මගින් නියම කළ හැකි වැඩිම දඩයෙහි ගණනට වඩා වැඩි විය හැකි නමුදු, ඒ සුලු අපරාධ අධිකරණය

මගින් නියම කරනු ලැබූ දඩයක් මෙන්, අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ තැනැත්ති පදිංචි ස්ථානයෙහි අධිකරණ බලය දරණ සුළු අපරාධ අධිකරණයට ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර අය කර ගත හැකිය.

(8) මේ පනත යටතෙහි පනවනු ලැබූ යම් නියෝගවලට යටත්ව විනිශ්වය සභාව විසින් ස්වකීය කාර්යය පටිපාටිය විධිමත් කළ හැකිය.

විනිශ්වය සභාවෙහි සාමාජිකයන්හට ගෙවීම්

30. මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නිශ්වය කළ හැකි ගෙවීම් විනිශ්වය සභාවෙහි සාමාජිකයන්ට ගෙවිය හැකිය.

## VI වෙනි කොටස

## සාමාන්‍ය කරුණු

වාර්තා ආදිය ගෙන්වා ගැනීමට කොමසාරිස්වරයාගේ බලය

2012 අංක 01

31. (1) මේ පනතෙහි කාර්යයන් සඳහා කොමසාරිස්වරයා විසින් --

(අ) තමාට අවශ්‍ය විය හැකි විස්තර ඇතුළත් වාර්තාවක් ද,

(ආ) එසේ සපයන ලද ඕනෑම වාර්තාවක සඳහන් කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් තමන්ට අවශ්‍ය විය හැකි ලිපිගත විස්තරයක් ද

නියමයෙහි නියමිත දිනයකට පෙර තමාට සපයන ලෙස යම් තැනැත්තකුට ලියවිල්ලකින් නියම කළ හැකිය.

1988 අංක 42

ඒ තැනැත්තා ඒ විධානය ඉෂ්ට කළ යුතුය. ගැසට් පත්‍රයෙහි හා ලංකාවෙහි පැතිරෙන ප්‍රවෘත්ති පත්‍ර දෙකක හෝ වැඩි ගණනක දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමෙන් මේ උප වගන්තියෙහි පෙරාතුව සඳහන් විධිවිධාන යටතෙහි නියමයක් කළ හැකිය.

(2) මේ වගන්තියෙහි (1) වෙනි උප වගන්තිය යටතෙහි ලේඛනයක් සපයන යම් තැනැත්තකු විසින් ඒ ලේඛනයෙහි අන්තර්ගත කරුණු රහසිගත ලෙස සැලකිය යුතු බවට ලිපිගත ඉල්ලීමක් ඒ ලේඛනයත් සමග එවිය හැකිය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාගේ අනුමතිය කලින් ලබා නො ගෙන , ඒ ලේඛනයෙහි අන්තර්ගත කරුණු අනාවරණය නො කළ යුතුය.

(3) මේ පනතින් හැර, යම් ලිඛිත නීතියක විධිවිධානවලින් හෝ ඒවා යටතෙහි හෝ එවැනි තැනැත්තකු විසින් එසේ අනාවරණය කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කරනු ලැබූ යම් අවස්ථාවක යම් විස්තරයක් අනාවරණය කිරීම සඳහා හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා මේ වගන්තියෙහි පෙරාතුව සඳහන් විධිවිධාන කිසිවකින් යම් තැනැත්තකුට නියම වන බව හෝ අවසර ලැබෙන බව නො සැලකිය යුතුය.

1988 අංක 42

භූමි ආදිය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ හා වෙනත් නිලධරයන්ගේ බලතල

31 අ. මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව යම් දායක මුදලක් සමග වාර්තාවක් සැපයීමට නියමිත යම් සේවායෝජකයකු නියමිත කාලය ඇතුළත එම වාර්තාව සැපයීමට අපොහොසත් වන නැතහොත් සාවද්‍ය හෝ ඌනතා සහිත වාර්තාවක් සපයා ඇති අතර, තත් කාලය සඳහා එම වාර්තාව සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි කරුණු දැක්වීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, නිසි පරිදි සම්පූර්ණ කරන ලද වාර්තාව ශ්‍රී ලංකා මහබැංකුවට ලැබිය යුතු අවසාන දින හෝ ඊට පෙර සිට එය මහ බැංකුවට ලැබුණු දින දක්වා සෑම පූර්ණ මාසයක් හෝ එහි කොටසක් සඳහා ම එම දායක මුදලින් සියයට දෙක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

2012 අංක 02

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 අ වගන්තියේ, “සියයට එකක අනුපාතිකයට ” යන වචන වෙනුවට “සියයට දෙකක අනුපාතිකයට ” යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2012 අංක 02

31 ආ. (1) අවම වශයෙන් සේවා නියුක්තියන් පනහක් ඔහුගේ සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින් ම එම මාසයට පසුව එළඹෙන මාසයේ අවසානයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට පිටපතක් සහිතව නියම කරනු ලබන විස්තර ඇතුළත් මාසික වාර්තාවක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වාර්තා ඉදිරිපත් කිරීමට ඇති කාර්යභාරය

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති සෑම වාර වාර්ථාවක් ම 2012 ජූලි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි විද්‍යුත් මාධ්‍ය මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

32. නියම කළ හැකි කොන්දේසිවලට හා නියමවලට යටත් ව කොමසාරිස්වරයා හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු මේ පනතෙහි විධිවිධාන ඉෂ්ට කිරීමේ කාර්යයන් සඳහා --

(අ) යම් සේවකයකුගේ ඉපයීම් සම්බන්ධ යම් ලේඛනයක් හෝ වාර්තාවක් පරීක්ෂා කිරීම සඳහා දවල් හෝ රාත්‍රියෙහි යුක්ති සහගත යම් වේලාවක යම් භූමියකට හෝ ස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කර බැගිය හැකිය;

(ආ) එබඳු ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි කොටසක පිටපත් ගත හැකිය;

(ඇ) සේවා යෝජකයකු හෝ සේවකයකු බව විශ්වාස කිරීමට ඔහුට යුක්ති සහගත හේතු ඇති යම් තැනැත්තකු පරීක්ෂා කළ හැකිය;

(ඈ) යම් අර්ථ සාධක අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් සම්බන්ධ යම් වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කළ හැකිය.

1971 අංක 08

ප්‍රධාන පනතේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ.

33. ආවරණය වූ සේවා නියුක්තියක සිටින සේවා නියුක්තියන්ගේ සෑම සේවායෝජකයකුම කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබ ගැසට් පත්‍රයේ දැනුම් දෙන අන්දමේ වාර්තා තබාගත යුතුය. සේවා යෝජකයන් විසින් වාර්තා තබාගත යුතු බව

34. (අ) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ එය යටතෙහි සම්පාදිත යම් නියෝගයක් කඩ කරන, හෝ

(i) එම වගන්තියේ (ආ) ඡේදයෙහි ඇති " අසත්‍ය හෝ සාවද්‍ය ; හෝ ", යන වචන වෙනුවට " අසත්‍ය හෝ සාවද්‍ය ;" යන වචන ආදේශ කිරීමෙන් ; වරදවල්

(ආ) තමාගේ දැනුම අනුව අසත්‍ය හෝ වැරදි යම් තොරතුරක් හෝ එසේ වූ කරුණුවලින් කොටසක් අන්තර්ගත ලේඛනයක් මේ පනතෙහි කාර්යයන් සඳහා සපයන, හෝ

යම් තැනැත්තකු මේ පනත යටතෙහි වරදක් සම්බන්ධයෙන් වරද කරුවකු විය යුතුය.

(ii) එම වගන්තියේ (ඇ) ඡේදයේ ඇති " 32 වන වගන්තිය යටතේ ඇති බලතල ", යන වචන වෙනුවට " 32 වන වගන්තිය යටතේ ඇති බලතල ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; 1985 අංක 01

(ඇ) කොමසාරිස්වරයා හෝ වෙන යම් නිලධාරියකු 32 වෙනි වගන්තිය යටතෙහි තම බලතල ක්‍රියාවෙහි යෙදවීම ඕනෑකමින් පමා කරන හෝ අවහිර කරන

` (ඈ) 27 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයක් උල්ලංඝනය කරන, "

වරදවල් සම්බන්ධයෙන් සේවායෝජකයාගේ කළමනාකරු, නියෝජතයා යනාදීන්ගේ වගකීම.

35. මේ පනත යටතෙහි සේවා යෝජකයකු විසින් වග කිය යුතු වරදක් වශයෙන් ගණන් ගැනෙන ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හෝ යම් කළමනාකරුවකු, නියෝජිතයකු, මෙහෙකරුවකු හෝ වෙන තැනැත්තකු විසින් ඇත්ත වශයෙන් කරනු ලැබූ හෝ සිදු කරනු ලැබූ අවස්ථාවක, කළමනාකාරයා, නියෝජිතයා, මෙහෙකරුවා හෝ වෙන තැනැත්තා සේවා යෝජකයා මෙන් ඒ ආකාරයෙන් ම ඔහුට විරුද්ධ වරද සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබීමට බැඳී සිටිය යුතු අතර , සේවා යෝජකයාත් සමග හෝ සේවා යෝජකයා වරදකරු කිරීමට පෙර හෝ පසුව සේවා යෝජකයා මෙන් ඔහු දඩුවම් ලැබීමටද යටත් විය යුතුය.

වෙන යම් තැනැත්තකු වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු බව සේවා යෝජකයා ඔප්පු කරන අවස්ථාවක

36. (1) මේ පනත යටතෙහි වරදක් සම්බන්දයෙන් යම් සේවා යෝජකයකුට විරුද්ධව චෝදනා කරනු ලැබූ අවස්ථාවක, අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 148 වෙනි වගන්තියෙහි විධිවිධාන අනුව ඔහු විසින් නිසියාකාර පැමිණිලි කිරීමෙන් හා ඔහුගේ අදහස සම්බන්ධව තුන් දිනකට නොඅඩු දැන්වීමක් පැමිණිලි පක්ෂයට දීමෙන් ද පසු , එම සංග්‍රහයෙහි XV වෙනි පරිච්ඡේදයෙහි විධිවිධානවලට යටත්ව , නියම වරදකරු වශයෙන් ඔහු චෝදනා කරනු ලබන අන් කිසි තැනැත්තකු අධිකරණය ඉදිරියට ගෙන ඒමට ඔහුට හිමිකමක් තිබිය යුතුය. ඒ අනෙක් තැනැත්තා විසින් වරද සිදු කළ බව ඔප්පු කරනු ලැබීමෙන් පසු , මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම සඳහා ඔහු නිසි උද්යෝගයක් ගත් බව ද ඔහුගේ දැනීම, අනුමතිය හෝ එකඟවීම නොමැතිව ඒ අනෙක් තැනැත්තා වරද සිදු කළ බවද සේවා යෝජකයා විසින් අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරන්නේ නම්, ඒ අනෙක් තැනැත්තා වරද සම්බන්ධයෙන් වරද කරුවකු කළ යුතුය. වරද සම්බන්ධ යම් දඩුවමකින් සේවා යෝජකයා නිදහස් විය යුතුය.

16 අධිකාරය

(2) මේ වගන්තියේ (1) වෙනි උප වගන්තියෙහි සඳහන් කරනු ලැබූ යම් අවස්ථාවක, සේවා යෝජකයකු විසින් අන් කිසි තැනැත්තකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන විට --

(අ) ඒ අනෙක් තැනැත්තාට විරුද්ධ පැමිණිල්ල සේවා යෝජකයා විසින් හෝ ඔහු වෙනුවෙන් පවත්වා ගෙන යා යුතුය ;

(ආ) ඒ අනෙක් තැනැත්තාට විරුද්ධ නීති කටයුතු වලදී පැමිණිලි පක්ෂය විසින් කැඳවනු ලබන යම් සාක්ෂිකරුවකුගෙන්, කොමසාරිස්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හරස් ප්‍රශ්න ඇසිය හැකිය; තවද

(ඇ) ඒ අනෙක් තැනැත්තාට විරුද්ධව නීති කටයුතු විනිශ්චය කරන තුරු, සේවා යෝජකයාට විරුද්ධ නඩුවෙහි නීති කටයුතු කල් තැබිය යුතුය.

වරදවල් සඳහා දඩුවම්

37. (1) මේ පනත යටතෙහි වරදකට වරදකරුවකු වන හැම කෙනකුම, සුලු අපරාධ විනිශ්චයකාරයකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් වරදකරුවකු වීමෙන් පසු රුපියල් එක් දාහකට නොවැඩි දඩයනට හෝ හය මාසයකට නොවැඩි කාල පරිච්ඡේදයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩුවම් දෙකින්ම දඩුවම් ලැබීමට බැඳී සිටිය යුතුය . තවද වරදකරුවකු වීමෙන් පසු ඉදිරියටත් ඒ වරද කරන එක් එක් දිනයක් සඳහා අතිරේකව රුපියල් පනහකට නොවැඩි දඩයක් ගෙවීමට ද බැඳී සිටිය යුතුය.

(2) මේ පනත යටතෙහි සේවා යෝජකයකු විසින් ගෙවීමට බැඳී සිටින යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්දයෙන් ඔහු වරදකරුවකු

කරනු ලැබූ අවස්ථාවක, වෙන යම් දඩුවමකට අතිරේකව ඒ මුදල ගෙවීමට අධිකරණය මගින් සේවා යෝජකයාට නියම කළ හැකිය.

11. ප්‍රධාන පනතේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1971 අංක 08

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තිය 37 වන වගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්,

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ " රුපියල් දහසක් නො ඉක්මවන දඩයකට " , සහ " එක් එක් දිනය සඳහා රුපියල් පනහක් නො ඉක්මවන දඩයකට " යන වචන වෙනුවට අනුපිළිවෙලින් " රුපියල් දෙදහස් පන්සියයක් නො ඉක්මවන දඩයකට " , සහ " එක් එක් දිනය සඳහා රුපියල් හැත්තෑ පහක් නො ඉක්මවන දඩයකට " යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2012 අංක 02

පනතේ 38 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ.

1971 අංක 08

ඇතැම් අවස්ථාවලදී අය විය යුතු හිඟ මුදල අය කර ගැනීම

38. (1) මේ පනත යටතේ ගෙවීමට සේවා යෝජකයකු යටත් වන යම් මුදලක් ගෙවීම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇත්තාවූ ද පනතේ 17 වන වගන්තිය යටතේ අය කර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන්නාවූ ද අවස්ථාවක, ඔහු විසින් පැහැර හැරීම කරන සේවායෝජකයා පදිංචි හෝ එම සේවායෝජකයාට අයිති චංචල හෝ නිශ්චල යම් දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත අයවිය යුතු මුදලද ඒ සේවායෝජකයාගේ නම හා පදිංචි ස්ථානය පිළිබඳ විස්තරද ඇතුළත් සහතිකයක් නිකුත් කළ හැකි අතර අධිකරණය විසින් ඊට පසුව පැහැර හැරීම කරන සේවායෝජකයාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ එසේ අයවිය යුතු මුදල ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය යයි පිස්කල්වරයා විසින් අදහස් කරන එයින් කොටසක් තහනමට ගෙන විකිණීමට පිස්කල්වරයාට බලය දෙන සහ නියම කෙරෙන ක්‍රියාවෙහි යෙදවීමේ රීඩ් ආඥාවක් නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය . එම තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(2) මේ පනත යටතේ ගෙවීමට සේවා යෝජකයකු යටත් වන යම් මුදලක් ගෙවීමෙහි ලා එම සේවායෝජකයා විසින් පැහැර හැරීමක් කරන්නාවූ ද පනතේ එම මුදල 17 වන වගන්තිය හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අය කර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන කොමසාරිස්වරයාගේ මතය වන්නාවූ ද අවස්ථාවක, හෝ අයවිය යුතු සම්පූර්ණ මුදල දේපළ තහනමට ගැනීම සහ විකිණීම මගින් අයකර ගෙන නොමැති අවස්ථාවක ඔහු විසින් එසේ අයවිය යුතු මුදල සහ පැහැර හැරීම කරන සේවායෝජකගේ නම සහ පදිංචි ස්ථානයද පිළිබඳ විස්තර අඩංගු සහතිකයක් එම ස්ථානය පිහිටි කොට්ඨාශය තුළ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ හැකිය. මහෙස්ත්‍රාත්වරයා එවිට මේ පනත යටතේ අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු ඔහුට විරුද්ධව නොකළ යුත්තේ මන්ද යන්නට හේතු පෙන්වීම සඳහා තමා ඉදිරියට සේවායෝජකයා කැඳවිය යුතුය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් එම මුදල මහෙස්ත්‍රාත්වරයා විසින් බන්ධනාගාරගත කිරීමෙන් දඩුවම් කළ හැකි වරදක් සඳහා එම සේවායෝජකයා වෙත දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් ලෙස සළකනු ලැබිය යුතු අතර එවැනි වරදක්

සඳහා නියම කරන ලද දඩයක් නොගෙවීම සම්බන්ධයෙන් අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 312 වන වගන්තියේ විධිවිධාන ( එහි (1) වන උපවගන්තියේ (අ), (ඇ) සහ (ඌ) ඡේද හැර ) ඊට පසු අදාළ විය යුතුය. මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේ එම උපවගන්තියේ විධිවිධාන මගින් මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තකදී ප්‍රශ්න කිරීම හෝ අධිකරණයක් විසින් විභාග කිරීම නොකළ යුතු අතර ඒ අනුව මේ වගන්තියේ වූ කිසිවකින් එවැනි යම් සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය සළකා බැලීමට හෝ තීරණය කිරීමට අධිකරණයට බලය නොලැබිය යුතු ය . කොමසාරිස්වරයාගේ සහතිකය මේ පනත යටතේ පැහැර හැරීම කරන සේවායෝජකයාගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය නිසි පරිදි ගණන් බලනු ලැබූ බවටද එම මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බවටද ප්‍රමාණවත් සාක්ෂි විය යුතුය.

(4) මේ පනතේ 17 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇතද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1985 අංක 01

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති “ ගෙවීම පැහැර හරින සේවා යෝජකයා පදිංචිව සිටින හෝ ඒ සේවායෝජකයාට අයිති යම් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටා ඇති යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති ” යන වචන වෙනුවට “ ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තේ අරමුදලේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා හෝ සාමාජිකයන්, ගෙවීම පැහැර හැර ඇති සේවායෝජකයා විසින් සේවයේ නියුක්ත කර ඇති හෝ සේවයේ නියුක්ත කරනු ලැබ ඇති දිස්ත්‍රික්කයේ අධිකරණ බලය ඇති ” යන වචන ආදේශ කිරීමෙන්, ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති “ ඒ ස්ථානය පිහිටා ඇති කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ” යන වචන වෙනුවට “ ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තේ අරමුදලේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ සේවා ස්ථානය පිහිටි කොට්ඨාසයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ” යන වචන ආදේශ කිරීමෙන්.

1971 අංක 08

ප්‍රධාන පනතේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

ඔප්පු කිරීමේ භාරය

39. මේ පනත යටතේ යම් සේවා යෝජකයකුගෙන් අයවිය යුතු මුදලක් ගෙවීමට අසමත්වීම සම්බන්ධයෙන් මේ පනතේ 17 වන වගන්තිය යටතේ ඒ සේවායෝජකයාට විරුද්ධව වූ නඩු කටයුත්තකදී, එම මුදල ගෙවූ බව ඔප්පු කිරීමේ භාරය සේවායෝජකයා වෙත විය යුතුය.

40. මේ පනත යටතෙහි තැනැත්තන් මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක ---

තැනැත්තන් මණ්ඩලයක් විසින් කෙරෙන වරදවල්

(අ) ඒ තැනැත්තන් මණ්ඩලය ඒකාබද්ධ මණ්ඩලයක් නම්, ඒ ඒකාබද්ධ මණ්ඩලයෙහි හැම අධ්‍යක්ෂයකු හා නිලධරයකු ද,

(ආ) ඒ තැනැත්තන් මණ්ඩලය වෙළෙඳ සමාගමක් නම් , ඒ වෙළෙඳ සමාගමෙහි හැම කොටස්කරුවකුද

(ඇ) ඒ තැනැත්තන් මණ්ඩලය වෘත්තීය සංගමයක් නම් , ඒ වෘත්තීය සංගමයෙහි හැම නිලධරයකු ද,

ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු වශයෙන් සැලකිය යුතුය.

එසේ වුවද තමාගේ දැනීමක් නොමැතිව ඒ වරද කරනු ලැබූ බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා නිසියාකාර සියලු උද්යෝගයන් ඔහු දැරූ බව ඔප්පු කරන්නේ නම් එබඳු ඒකාබද්ධ මණ්ඩලයක් අධ්‍යක්ෂකයකු හෝ නිලධරයකු හෝ එබඳු වෙළඳ සමාගමක කොටස්කරුවකු හෝ එබඳු වෘත්තීය සංගමයක නිලධරයකු ඒ වරද සම්බන්ධ වරදකරුවකු වශයෙන් නො සැලකිය යුතුය.

කොමසාරිස්වරයාගේ අනුදැනීම නොමැතිව නඩු නොපැවරීම

41. කොමසාරිස්වරයාගේ ලිපිගත අනුදැනීමෙන් හෝ අනුදැනීම ඇතිව මිස , මේ පනත යටතෙහි වරදක් සඳහා කිසි නඩුවක් පැවරිය නොයුතුය.

නියෝග හා ආඥා ආදිය සත්‍ය බැව් ඔප්පු කිරීම.

42. (1) මේ පනත යටතෙහි සම්පාදනය කරන ලද යම් නියෝගයක් හෝ ආඥාවක් අන්තර්ගත ගැසට් පත්‍රයෙන් උපුටා ගත් කොටසක් හෝ කොමසාරිස්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන එබඳු නියෝගයක හෝ ආඥාවක පිටපතක්, ඒ නියෝගය හෝ ආඥාව සත්‍ය බැව් ඔප්පු කිරීම වශයෙන් අධිකරණයට ඉදිරිපත් කළ හැකිය.

(2) යම් නීති කටයුත්තකදී ---

(අ) සත්‍ය පිටපතක් යයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණකාධිකාරියකු විසින් සහතික කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන, මේ පනතෙහි කාර්යයන් සඳහා මුදල් මණ්ඩලය විසින් තබන ලද ගණන් පොත්වල සටහනක පිටපතක්, හෝ

(ආ) සත්‍ය පිටපතක් යයි කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන, මේ පනතෙහි කාර්යයන් සඳහා ඔහු විසින් තබන ලද යම් පොතක හෝ වාර්තාවක හෝ සටහනක පිටපතක්,

ඒ සටහන කරනු ලැබූ බවට හා එහි අන්තර්ගත කරුණු සම්බන්ධව විනිශ්චයට භාජනය විය යුතු යයි හැගෙන සාක්ෂි විය යුතුය.

ආදායම් බද්දෙන් නිදහස් කිරීම

43. (1) අරමුදලෙහි යම් මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම, ආදායම් බදු ආඥාපනත යටතෙහි අය කළ යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

188 අධිකාරය

(2) අරමුදලෙහි සාමාජිකයකු සම්බන්ධයෙන් මේ පනත යටතෙහි ප්‍රතිලාභයක් වශයෙන් ගෙවනු ලැබූ මුදල , අවස්ථා පරිදි ඒ සාමාජිකයා විශ්‍රාම ගැනීමට හෝ ලංකාවෙන් බාහාර යාමට හෝ මිය යාමට පෙරාතුව ම අවුරුදු පහ ඇතුළත තක්සේරු කළ හැකි ඔහුගේ සාමාන්‍ය වාර්ෂික ආදායම රුපියල් හාර දහස් අට සියයට වැඩි නොවන්නේ නම් , එය ආදායම් බදු පනත යටතෙහි අය කළ යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

188 අධිකාරය

(3) අරමුදල, ආදායම් බදු පනතෙහි කාර්යයන් සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් වශයෙන් සැලකිය යුතුය.

188 අධිකාරය

මේ උප වගන්තියෙහි “ කොමසාරිස්වරයා ” යන පදය ආදායම් බදු පනතෙහි එම අර්ථයම දැරිය යුතු ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම

44. මේ පනතෙහි නියම කළ හැකි කාර්යයන් හා සම්බන්ධව පාවිච්චි කරනු ලබන ලේඛනයක් සඳහා මුද්දර ගාස්තු අය නොකළ යුතුය.

මේ පනත යටතෙහි ක්‍රියා කිරීම සම්බන්ධ ආරක්ෂාව

45. මේ පනත හෝ එය යටතෙහි සම්පාදිත නියෝග ක්‍රියාවෙහි යෙදවීමේදී නිර්ව්‍යාජත්වයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකුට විරුද්ධව නඩුවක් හෝ නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් ඇති නොවිය යුතුය.

නියෝග

46. (1) (අ) නියම කළ යුතු යයි මේ පනතින් දක්වන ලද හෝ අවශ්‍ය වන ලද සියලුම කරුණු සම්බන්ධයෙන් ද;

(ආ) නියෝග සම්පාදනය කිරීමට මේ පනතින් අවශය වූ හෝ බලය පවරනු ලැබූ සියලු කරුණු සම්බන්ධයෙන් ද;

(ඇ) මේ පනත යටතෙහි දායක මුදල් හා වෙනත් ගෙවීම් එකතු කිරීම හා සම්බන්ධ හෝ එයට ප්‍රාසාංගික වූ සියලු කරුණු සම්බන්ධයෙන් ද;

(ඈ) අරමුදලට වැරදීමකින් ගෙවන ලද යම් මුදලක් ආපසු ගෙවීම් සම්බන්ධයෙන් ද;

(ඉ) අරමුදලෙහි සාමාජිකයකු විසින් , ඔහු ලංකාව හැර යන බවට හා නැවත මෙහි ඒමට අදහස් නො කරන බවට කරන ලද ප්‍රකාශයක් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි සම්බන්ධයෙන් ද;

(ඊ) දරුවකු වූ හෝ අවස්ථාවෙහි ක්‍රියා කිරීමට නො හැකි කෙනෙකු වූ ප්‍රතිලාභයකට හිමිකම් කියන්නකුට මේ පනත යටතෙහි පාවිච්චි කිරීමට හිමිකම් ඇති යම් අයිතිවාසිකමක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් කියන්නා වෙනුවෙන් තැනැත්තකු පත් කිරීමට හැකි වීම සඳහා ද , හිමිකම් කියන්නකුට හිමිකමක් ඇති ප්‍රතිලාභයක් භාර ගැනීමට හා ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට එසේ පත් කරන ලද තැනැත්තකුට බලය පැවරීම සඳහා ද;

(උ) සාමාජිකයකු මිය ගිය අවස්ථාවෙක අරමුදලෙහි ඒ සාමාජිකයාගේ පුද්ගලික ගණනෙහි අය පක්ෂයට තිබෙන ගණන ගෙවනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් සාමාජිකයකු විසින් නම් කිරීම හා එසේ නම් කිරීම , අවලංගු කරන අන්දම සම්බන්ධයෙන් ද;

(ඌ) මේ පනත යටතෙහි සංස්ථාපිත විනිශ්චය සභාවකට ආයාචනා ඉදිරිපත් කළ යුත්තේ කුමන අන්දමකට හා කුමන කාලයක් ඇතුළත ද යන්න සම්බන්ධයෙන් ද;

(එ) ආයාචනා සඳහා ඒ විනිශ්චය සභාවට ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් ද;

(ඒ) ඒ විනිශ්චය සභාව අනුකරණය කළ යුතු ක්‍රියා පරිපාටිය හා පාවිච්චි කළ හැකි බලතල සම්බන්ධයෙන් ද;

(ඔ) විනිශ්චය සභාවකට ඉදිරිපත් කරන ලද ආයාචනයකට පාර්ශ්වකාරයකු වූ කෙනකුට විරුද්ධව ඒ විනිශ්චය සභාව විසින් ගාස්තු ප්‍රදානය කළ හැකි කරුණු හා ඒ ගාස්තු ආපසු අය කර ගැනීමේ අන්දම සම්බන්ධයෙන් ද;

(ඕ) (i) මේ පනත යටතෙහි ප්‍රථම අවස්ථාවෙහි හෝ ආයාචනයෙහි ප්‍රතිලාභයක් සම්බන්ධයෙන් යම් ඉල්ලීමක් හෝ ප්‍රතිලාභයක් සම්බන්ධ යම් තැනැත්තකුගේ අයිතිවාසිකම කෙරෙහි හෝ අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධ යම් තැනැත්තකුගේ බැඳී සිටීම කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයක් නිශ්චය කරන කරු හෝ

(ii) එබඳු ඉල්ලීමක හෝ ප්‍රශ්නයක යම් තීරණයක් ආයාචනයෙහි දී පරිශෝධනය කිරීමෙන්,

පැන නගින කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද;

(ක) යම් ප්‍රතිලාභයක් සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධ විනිශ්වය කොමසාරිස්වරයා විසින් නැවත සලකා බලන තුරු ඒ ප්‍රතිලාභය ප්‍රදානය කිරීම අත්හිටවීම සඳහා ද;

(ග) මේ පනත යටතෙහි නැවත සලකා බැලීමක් හෝ ආයාචනයක් සම්බන්ධ තීරණයක් බලපෑ යුතු හෝ බලපාන්නේ යයි සැලකිය යුතු දිනය සම්බන්ධයෙන් ද;

(ච) නො ගෙවිය යුතු යයි පසුව තීරණය කරනු ලබන , මේ පනත යටතෙහි කරන ලද යම් විනිශ්වයක් යටතෙහි හෝ යම් නියෝගයක යම් විධිවිධානයක බලය හේතු කොට හෝ යම් තැනැත්තකුට ගෙවනු ලැබූ යම් මුදලක් නිසියාකාර ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබීම සඳහා හෝ ඔහු විසින් ආපසු ගෙවීම සඳහා ඔහුගෙන් ඒ මුදල ආපසු ලබා ගැනීම සඳහා ද;

(ජ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම සඳහා සේවයෙහි යොදවනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්හට දීමනාවන් ගෙවීම හා ඒ දීමනාවන් ගණන් බලන ක්‍රමය සඳහා ද;

1971 අංක 08

14. ප්‍රධාන පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය, එහි (ජ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

(ජජ) මේ පනතේ කාර්ය පරිපාලනය සම්බන්ධයෙන් සේවායෝජකයන්ගෙන් අයකළ යුතු ගාස්තු අයකර ගැනීම සහ සිදුවන පාඩු කපා හැරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- — ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම. 2012 අංක 02

(ගග) නිවාස ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ප්‍රතිලාභ ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ;

1985 අංක 01

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට , සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(ට) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම හෝ එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් ද;

ඇමතිවරයා විසින් නියෝග සම්පාදනය කළ හැකිය.

(2) උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කොට ගැසට් පත්‍රයෙහි ඒ අනුමත කිරීම ගැන දැන්වීමක් පළ කරනු ලබන තුරු ඇමතිවරයා විසින් සම්පාදිත කිසි නියෝගයක් බල නො පෑ යුතුය.

එසේ අනුමත කරනු ලැබූ හැම නියෝගයක් ම මෙහිදී පනවනු ලැබූ නියෝගයක් මෙන් වලංගු විය යුතුය; බල පෑ යුතුය.

අර්ථ නිරූපණය

47. මේ පනතෙහි පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය නොවූ විටෙක-

" කොමසාරිස්වරයා " යන්නෙන් කම්කරු කොමසාරිස්වරයා අදහස් වේ;

" රක්ෂිත වෘත්තිය " යන්නෙන් රක්ෂිත වෘත්තියක් විය යුතු යයි නියෝගයෙන් ප්‍රකාශ කරනු ලැබූ වෘත්තියක් අදහස් වේ.

" ඉපැයීම " යන්නෙන් ----

(අ) මූලික වේතන හෝ වැටුප්

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව හා වෙනත් එවැනි දීමනා ;

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) " ආරක්ෂිත සේවා නියුක්තිය " යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :-

" නිසි පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලය " යන්නෙන් සාධාරණ සැකයට හේතුවන වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇති තැනැත්තන් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් කරණු ලැබූ ඉල්ලීමක් මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලැබූ වෛද්‍ය මණ්ඩලයක් අදහස් වේ; :

(2) " ඉපයීම් " යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

" ඉපයීම් " යන්නෙන් --

(අ) පඩි , වැටුප් හෝ ගාස්තු ;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව සහ වෙනත් සමාන දීමනා;

(ඇ) නිවාඩු දින සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම්;

(ඈ) නියමිත සේවා නියුක්තිවල සේවා නියුක්තයන්ට සේවායෝජකයා විසින් සපයනු ලැබූ පිසූ හෝ නොපිසූ ආහාරවල මුදල් වටිනාකම සහ එසේ සපයනු ලැබූ ආහාර පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ හෝ එම ආහාරවල අඩංගු හෝ යම් ද්‍රව්‍යයක මුදල් වටිනාකම ; සේවා යෝජකයා විසින් තක්සේරු කළ යුතු එම වටිනාකම කොමසාරිස්වරයා වෙත කරනු ලබන අභියාචනයකට යටත් විය යුතු අතර එම අභියාචනය පිළිබඳව කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතුය;

(ඉ) ආහාර දීමනාව ; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් අන්දමේ පාරිශ්‍රමික

අදහස් වේ;

(3) " සේවා නියුක්තයා " යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

" සේවා නියුක්තයා " යන්නෙන් සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම ප්‍රකාශිත හෝ ගම්‍යමාන නැතහොත් වාචික හෝ ලිඛිත වූ ද ඒ ගිවිසුම සේවය සම්බන්ධයෙන් හෝ ආධුනිකත්වය සම්බන්ධයෙන් හෝ ගිවිසුමක් වුවද නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් වූ යම් වැඩක් පෞද්ගලිකවම ක්‍රියාත්මක කිරීම පිණිස වූ ගිවිසුමක්

වුවද කවර වූ යම් තත්ත්වයකින් සේවා යෝජකයකු සමග ගිවිසුමකට ඇතුලු වූ හෝ ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තකු අදහස් වන අතර යම් තැනැත්තකු යම් විශේෂ අවස්ථාවකදී සේවයෙහි නියුක්ත වුවද සේවයෙහි නියුක්ත නොවූවද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත ඒ තැනැත්තා ද ඇතුළත් වේ;

(4) “ සේවා යෝජකයා ” යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-
“ සේවා යෝජකයා ” යන්නෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර සේවායෝජක මණ්ඩලයක්, ( ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සංගමයක් ) සහ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ . තවද නීත්‍යානුකූල උරුමක්කරු, නීතිය අනුව අනුප්‍රාප්තිකයා, පොල්මෑකරු, හෝ අද්මිනිස්ත්‍රාසිකරු සහ සමාගමක ඇවරකරු ඊට ඇතුළත් වේ . තවද සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ද හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට එහි කළමනාකාර හවුල්කරු හෝ කළමනාකරු ද ඇතුළත් වේ:

48. අර්ථසාධක අරමුදලක් හෝ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් සම්බන්ධයෙන් සේවා යෝජකයකුගේ හෝ සේවකයකුගේ දායක මුදල් ප්‍රමාණය අරමුදල සම්බන්ධයෙන් සේවා යෝජකයකුගේ හෝ සේවකයකුගේ දායක මුදල් ප්‍රමාණයට වඩා ඉහළ වීමේ හේතු නිසා පමණක් අඩු නොකළ යුතුය.

49. අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද , මේ පනතෙහි විධිවිධාන බල පැවැත්විය යුතුය . මේ පනතෙහි විධිවිධාන හා එවැනි වෙනත් නීති අතර සට්ටනයක් හෝ ප්‍රති විරුද්ධත්වයක් ඇති වන යම් අවස්ථාවක මේ පනතෙහි විධිවිධාන බව පැවැත්විය යුතුය.

වෙනත් ලිඛිත නීතියක් සමග සට්ටනය වන අවස්ථාවක පනත බලපාන බව